www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාක යුද්ධය හා 2004 එක්සත් ජනපද ජනාධිපතිවරනය

## The war in Iraq and the 2004 US presidential elections

**ඩේවිඩ් නෝර්ත්**

---

ඇමරිකා එක්සත් ජනපදයේ අවුරුදු 4කට වරක් පැවැත්වෙන ජනාධිපතිවරනයට තව දෙමසක්වත් නැත. සමහරවිට මෙම ජනාධිපතිවරනයේ ප්‍රතිඵල සැබවින් ම, එරට තුල දීටත් වඩා එරටින් බාහිර රටවල දැඩි අවධානයට පාත්‍ර වී පවත්නා අතර ඉතා උනන්දුවකින් අපේක්ෂා කරනු ලැබේ. එසේ වීමට හේතුව වටහා ගැනීමට දුෂ්කර නැත. එක්සත් ජනපදය වනාහි සිය භූගෝලීය අරමුනු ඉටුකර ගැනීම සඳහා ඕනෑම දෙයක් කිරීමට සූදානම් කුරිරු ඉවබව නැති යුදවාදීන් විසින් පාලනය කරනු ලබන භයානක රාජ්‍යයක් ය යන හැඟීමක් ලොව පුරා පැතිර තිබේ. එම අදහස වනාහී මට ද විරුද්ධ විය නො හැකි එකකි. ජෝර්ජ් ඩබ්. බුෂ් තම ජනාධිපති අපේක්ෂකයා ලෙස යලි පත් කර ගැනීම සඳහා පසු ගිය සතියේ නිව් යෝක් නගරයේ පැවැත්වුනු රිපබ්ලිකන් පක්ෂයේ රැස්වීම එක්සත් ජනපදයේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂයක සම්ප්‍රදායික සම්මේලනයකට වඩා නියුරම්බර්ග්හි නාසි පක්ෂ දින රැලියකට සම විය. දේශපාලන විරෝධතාවන් වැලැක්වීමට හෝ බිඳදැමීමට වීදි පීරන දැවැන්ත පොලිස් දැලක් එහි ක්‍රියාත්මක වූ අතර සමුලුවෙන් පිටත නිව් යෝක් නගරයේ වීදි පීරා 2000ක් පමන දෙනා අත්අඩංගුවට ගනු ලැබූහ.

උපජනාධිපති ඩික් චෙනි - පෙර ද ඉදිරියේ දී ද හැලිබර්ටන් සමාගමේ තොරොම්බල්කරුවා වන මොහු දැන් ඇමරිකානු මාධ්‍ය කට පියාගෙන සිටින රහසිගත ආන්ඩුවේ නායකත්වය දරයි - හා ජෝර්ජ් බුෂ් යලි පත් කර ගැනීමේ දී විවෘතව හෝ රහසිගතව ඊට ආධාර කරන ඩිමොක්‍රැටික් පාක්ෂික කන්ඩායම වෙනුවෙන් කතා කරන ජෝර්ජියාවේ ඩිමොක්‍රැටික් පාක්ෂික සෙනේට් සභික සෙල් මිලර් වැන්නවුන්ගේ ෆැසිස්ට් ශෛලියේ කතා ඇසූ ප්‍රතිගාමීන් රොත්ත සමුලුව තුල තිරිසනුන් මෙන් හුරේ දැමූහ.

පාලක ප්‍රභූව තුල පැතිර පවතින ප්‍රජාතන්ත්‍ර විරෝධී, ඒකාධිපති, යුදවාදී හා අධිරාජ්‍යවාදී මනෝගතිය වඩාත් නියත ප්‍රකාශනය අත් කර ගන්නේ මිලර්ගේ කතාව තුල ය. “මාධ්‍ය නිදහස අපට ලබා දී ඇත්තේ වාර්තාකරු නො ව සොල්දාදුවා ය. කතා කිරීමේ නිදහස අපට ලබා දී ඇත්තේ කවියා නො ව සොල්දාදුවා ය.” යි ඔහු කීවේ ය. මාධ්‍යයෝ එක්සත් ජනපද ව්‍යවස්ථාවේ ද එහි පරිනාමයේ ද පදනම සකසන නෛතික න්‍යාය පමනක් නො ව රටේ සත්‍ය ඉතිහාසය විසින් ද ප්‍රතික්ෂේප කරනු ලබන මෙම ප්‍රකාශයට අවධානය යොමු නො කලාහ. හබෙයාස් කෝපුස් ආඥාව ද ඇතුලත් සියලු ව්‍යවස්ථාමය අයිතීන් සිවිල් සැකකරුවන්ට අහිමි කලා වූ හමුදා උසාවි යොදා ගැනීම නීත්‍යනුකූල කිරීමට ආන්ඩුව විසින් අත නො හැර දරන ලද උත්සාහයක් ගත වූ අවුරුදු තුන පුරා දකින්නට ලැබුනු තත්වය තුල මිලර්ගේ කතාව දක්ෂිනාංශික දේශපාලන උන්මත්තකයෙකුගේ හුදු නන්දෙඩවිල්ලක් ලෙස ඉවත ලිය නො හැක.

රිපබ්ලිකන් සමුලුව හමුවේ මිලර් කල කතාවේ අඩංගු තවත් ප්‍රකාශයක් මම මෙහි දී ගෙන හැර දක්වමි: “විදේශයන්හි දී අපගේ සොල්දාදුවන් විමුක්තිදායකයන් ද මෙරටෙහි දී ආරක්ෂකයන් ද වන බව යමෙක් මුලු හදින්ම විශ්වාස නො කරන්නේ ඔහු නම් මෙරටේ ප්‍රධාන අනදෙන නිලධාරියා වීමට සිතීම පවා නො කල යුතු ය."

මෙම ප්‍රකාශනය එක්සත් ජනපද ව්‍යවස්ථාවෙහි අන්තර්ගතය ද එහි සැලසුම්කරුවන්ගේ අභිප්‍රාය ද විකෘති කරයි. එහෙත් මිලර්ගේ ප්‍රකාශය කිසි ලෙසකින් වත් සියත් හෝ සුවිශේෂී එකක් නො වේ. දේශපාලකයන් ද මාධ්‍යකරුවන් ද ජනාධිපති රටේ “ප්‍රධාන අනදෙන්නා” ය යි නිරතුරුව අවධාරනය කිරීමේ අරමුන නම් ජනතාව නොමග යැවීමත් ඔවුන්ගේ ස්වාභාවික ප්‍රජාතන්ත්‍රවාදී ලැදියාවන්ට යටින් වල කැපීමත් එමෙන් ම මිලිටරි පොලිස් ආඥාදායකත්වයක් කරා මාරුවීම නීති යුක්ත කිරීමක් වේ.

එක්සත් ජනපද ව්‍යවස්ථාවේ II වන ඡේදයේ දෙවන කොටසේ පලමුවන වගන්තිය අනුව “එක්සත් ජනපද යුද හමුදාවේ ද නාවික හමුදාවේ ද අවශ්‍ය විටෙක කැඳවනු ලබන ප්‍රාන්ත රාජ්‍යයන් ගනනාවක සන්නද්ධ භටපිරිස්වල ද ප්‍රධාන අනදෙන්නා ජනාධිපති වන්නේ ය.” මෙම වගන්තියෙහි කිසිදු ව්‍යාකුලබවක් නැත. ජනාධිපති ප්‍රධාන අනදෙන්නා වන්නේ සමස්තයක් ලෙස රටෙහි ම නො ව මිලිටරියේ ය. ඔහු රටෙහි තෝරා පත් කර ගත් ප්‍රධාන විනිශ්චයකරුවා මිස ඒකාධිපති නායකයා නො වේ. ජනාධිපති ධුරයේ අතිරේක තනතුරු නාමය නිවැරදි ව යෙදුව හොත් ඉන් සලකුනු කෙරෙන්නේ ජනතාව තෝරා පත් කර ගත් සිවිල්

නියෝජිතයන් මිලිටරිය මත අධිකාරය දරන බව මිස මිලිටරිය ආන්ඩුවේ සිවිල් අංශය මත අධිකාරය දරන බවක් නො වේ. මිලර්ගේ කතාව වනාහි මූලික ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප ඇමරිකානු පාලක පන්තියෙන් කොයිතරම් ම සම්පූර්නව ගිලිහී ඇත් ද යන්න පිලිබඳ හුදු එක් උදාහරනයක් පමනක් වේ.

මෙහි දී අප හුදෙක් බුද්ධිමය පරිහානි සන්තතියක් සමග පොරබදනවා නො වේ. ඇමරිකානු ජනගහනයෙන් ඉතා කුඩා ස්ථරයක් අත නිර්දය ලෙස ධනය සමුච්චය වීම ධනේශ්වර පාලනය රඳාපවත්නා සැබෑ සමාජ පදනම අනිවාරනීය ලෙස හීන කර දමන්නා වූ බලපෑමක් ඇති කර තිබේ. පලල් ජනතාවගෙන් පිටස්තර වූ ද, සැලකිය යුතු දුරකට ස්වාධීන වූ ද, කොටස්වලින් සමන්විත වෙනත් පදනමක් නිර්මානය කිරීමට පාලක පන්තියට බලකෙරී ඇත. ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ පීඩක බලවේගයන් තර කිරීම සඳහා මිලිටරිය විසින් කුලියට ගත් කොන්ත්‍රාත් මිනීමරුවන්ගේ ද වධකයන්ගේ ද අතිරේක කන්ඩායම්වලින් අනුපූරනය වූ ඊනියා ස්වේච්ඡා යුද හමුදාවේ කාර්යභාරය මෙය යි. ඉරාකයේ නාගරික යුද්ධයේ අත්දැකීමෙන් ද සමහර කොටස් සම්බන්ධයෙන් ගත හොත් මහාපරිමාන සිවිල් වැසියන් පෙලීමේ හා මැරීමේ හුරුපුරුදු වී ඇතිවා පමනක් නො ව රසවැටී ඇත්තා වූ ද ඇමරිකානු සොල්දාදුවන්ගෙන් සමන්විත අන්තරායකාරී සමාජ කොට්ඨාශයක් මත එක්සත් ජනපදය තුල “නීතිය හා සාමය” රැකීම සඳහා පාලක ප්‍රභුව වඩ වඩාත් රැඳී සිට ගනු ඇත.

මීට සිව්වසරකට පෙර සිඩ්නි නුවර මෙම ශාලාවෙහි මා කතා කල බව ඔබ සමහරෙකුට මතක ඇත. ඒ 2000 නොවැම්බර් ජනාධිපතිවරන ඡන්ද විමසීම අවසන් වූ වහාම දෙසැම්බර් 3 වන දා ය. ප්‍රතිඵල තවමත් ප්‍රකාශ වී තිබුනේ නැත. එක්සත් ජනපදය තුල සම්ප්‍රදායික ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී රූපයන් කෙරෙහි කැපවීම කොතරම් දුරකට ඉතුරුව පවතී දැ යි මැතිවරන ප්‍රතිඵලය මගින් එලිකෙරෙනු ඇතැයි මම එහි දී කියා සිටියෙමි. ඉන් දෙසතියක් ඉක්මයෑමටත් පෙර ශ්‍රේෂ්ඨාධිකරනය මැදිහත් වී මතභේදාත්මක ෆ්ලොරිඩා ඡන්ද යලි ගනන්කිරීම නවතා එක්සත් ජනපදයේ ජනාධිපති ලෙස ජෝර්ජ් බුෂ් පත් කර ගත්තේ ය. එම සිද්ධිය ඇමරිකානු ඉතිහාසයේ හැරීම් ලක්ෂ්‍යයක් සලකුනු කරයි. එදා මෙදා තුර එහි ලෝක පරිමාන ඇඟවීම් එලිමහනට පැමින තිබේ.

පසුගිය සිව් වසරෙහි සිදුවීම් එක්සත් ජනපදය කුමක් දැයි යන්න පිලිබඳ භූගෝලීය දැක්ම ඇඩි ලෙස වෙනස් කර තිබේ. ඇමරිකානු සමාජය රෝසපැහැති උපනෙත්වලින් දැකගැනීමට සූදානම් නො වූ වොෂින්ටනය සිය ප්‍රජාතන්ත්‍රවාදී හා මිත්‍රශීලී අධ්‍යාසයන් පිලිබඳව කල තොරතෝංචියක් නැති ප්‍රකාශයන් අවිචේචනාත්මකව පිලිගැනීම ප්‍රතික්ෂේප කල ඒ පිලිබඳව හොඳින් සිතා බැලූ අය පවා කම්පා කර දැමීමට මෑතකල්හි සිදු වූ දෑ සමත්විය. ඇෆ්ගනිස්ථාන හා ඉරාක ආක්‍රමනයන් දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු නුවූ විරූ ආකාර සීමා ඉක්මවා ගිය අධිරාජ්‍යවාදයේ ස්වභාවය පිලිබඳ නිදසුන් සපයයි. අබු ග්‍රයිබ් සිර කඳවුරේ දී ගත් ඡායාරූපවලින් විදහා දැක්වුනු පරපීඩක කාමුකත්වයේ අසංගතයන් ඉරාකය මත ඇමරිකානු මිලිටරි ග්‍රහනයෙහි මූර්ග ස්වභාවය පිලිබඳව මුලුමහත් පරම්පරාවකම කොල්ලකාරී නිර්නායක ප්‍රමිතිය වනු ඇත.

සාමාන්‍ය ජීවිතයේ දී මෙන් ම දේශපාලනයේ දී ද දුෂ්කර හා බැරෑරුම් ගැටලුවලට සරල හා පහසු විසඳුම් සොයාගත හැකි යයි බලාපොරොත්තු වන ස්වාභාවික නැඹුරුවක් මිනිසුන් අතර පවතී. ජෝන් කෙරී එක්සත් ජනපදයේ ජනාධිපති වසයෙන් තෝරාගැනීම මගින් මුලුමහත් ජාත්‍යන්තර දේශපාලන වාතාවරනයේ, මූලික පරිවර්තනයක් නො වේ නම් අවම වසයෙන් වැඩිදියුනු වීමකට මග පාදනු ඇතැයි යන මතයේ සිත් ඇදගන්නා ස්වභාවය පවතින්නේ මෙතැන ය. මෙය පිලිගැනීමට ලැදි වූවෝ වත්මත් ඇමරිකානු පිලිවෙත ධවල මන්දිරයේ ලැගුම්ගන්නා අයගේ පෞද්ගලික චරිත ලක්ෂන මගින් පැහැදිලි කල හැකි ය යන සංකල්පයෙන් මුල පුරති. උත්ප්‍රාසාත්මකව මෙම සංකල්පය ජෝර්ජ් බුෂ් අන්ධබාල නිකමකුගේ සිට ලෝක ඓතිහාසික පෞරුෂයකට සමාන යමක් බවට පරිවර්තනය කරයි.

එහෙත් “ඉතිහාසයේ නපුරු බුෂ් න්‍යාය” අපගේ කාලයේ දැවැන්ත ගැටලුවලට විසඳුමක් සපයනවා තබා ඒවා අවබෝධ කර ගැනීමට මගපෙන්වීමක් හෝ සැපයීමට අසමත් වේ. කෙරීගේ මැතිවරන ව්‍යාපාරයේ බියගුලු හා බංකොලොත් බව තිබිය දී පවා ඔහු ජයගතහොත් එය ඇමරිකානු අධිරාජ්‍යවාදයේ විනාශකාරී හා ම්ලෙච්ඡ ගමන් මග කිසිදු සැලකිය යුතු අයුරකින් වෙනස් නො කරනු ඇත; ඉරාකයේ මිලිටරි ග්‍රහනය අවසන් නො කරනු ඇත; නුදුරේ දී තවතවත් යුද්ධ, වඩාත් විනාශකාරී යුද්ධ පවා, ඇතිවීමේ හැකියාව අඩු නො කරනු ඇත.

යමෙක් ඇමරිකානු විදේශ පිලිවෙත් ගමන් මග යම් දුරකට හෝ හැඩගැස්වීම බුෂ් හා ඔහුගේ කල්ලියේ චරිත ලක්ෂනවලට පැවරුවත් - මෙය නිවැරදි අදහසකි - එම ආත්මීය සාධකයට වුව ඇත්තේ ද්විතීයික වැදගත්කමක් පමනි. කුමක් වුවත් එක්සත් ජනපදයේ සමාජ හා දේශපාලන සංස්ථාපිතය තුල බුෂ්ගේ ප්‍රතිපත්ති එතරම් පුලුල් සහයෝගයක් බුක්තිවිඳීම යන කාරනය ම අවසානයේ දී පෙන්නුම් කරන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සූත්‍රගත කිරීමේ දී ජනාධිපතිගේ පුද්ගලික දුබලතාවන්ට වඩා බෙහෙවින් වැදගත් කරුනු අදාලව පවත්නා බව යි.

ඉරාක ආක්‍රමනය කිරීම හා යටත් කර ගැනීම ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදයේ දැවැන්ත අසාර්ථකත්වය පෙන්නුම් කරයි. ලොව සියල්ලන්ම දැන් දන්නා පරිදි මෙම යුද්ධය දියත් කරනු ලැබුවේ පට්ට බොරු පදනම් කරගෙන ය. පලමුවැන්න නම් ඉරාකය සතුව

ජනඝාතක අවි තිබුනේ ය යන්න යි. දෙවැන්න සදාම් හුසේන් තන්ත්‍රය අල්කයිඩාවට හිතවත් යයි ද, කෙසේ හෝ සැප්තැම්බර් 11 සිද්ධීන්ට සම්බන්ධ යයි ද ඇඟවුම් තිබුනු බව යි. තෙවැන්න නම් එක්සත් ජනපදය ඉරාකයට ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒමේ උත්සාහයක යෙදී සිටි බව යි.

2003 මාර්තු ආක්‍රමනයට පෙරාතුව මෙම ප්‍රකාශවලින් කිසිවක් දේශපාලන සංස්ථාපිතය හෝ මාධ්‍ය තුල බැරෑරුම් පරීක්ෂනයකට මාතෘකා වූයේ නැත. මෙම ප්‍රමාද දෝෂය අහම්බයක් වූයේ නැත. බුෂ් පරිපාලනයේ යුදකාමී ප්‍රතිපත්ති පාලක ප්‍රභුව ඇතුලත ද එහි ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකෙහි ද පුලුල් සහයෝගය භුක්ති විඳින තාක් දුරට යුද්ධයට පැනගැනීම සඳහා ආන්ඩුව ඉදිරිපත් කලා වූ හේතූන් පුලුල් පරීක්ෂනයකට ලක්කිරීමට උනන්දුවක් ඔවුන්ට තිබුනේ නැත. මෙම මුසාවාද පසුව එලිදරව් වුව ද පාලක ප්‍රභුව තුල ඉරාකය යුද්ධමය වසයෙන් අල්ලා ගැනීම කෙරේ පැවති සහයෝගය සැලකිය යුතු විවාදයකට ලක් නොවීම සලකුනු කරන්නේ මෙම දේශපාලන යථාර්ථය යි. 2002 ඔක්තෝබරයේ දී ඉරාකයට එරෙහිව යුදබලය යෙදීමට අනුමැතිය ලබාදුන් කුප්‍රකට සෙනේට් සභා යෝජනාවලියට පක්ෂව තමා දුන් ඡන්දය එම රටෙහි ජන සංහාරක අවි නො තිබුනු බවක් එකල්හි ම දැන සිටියා නම් වුව ද එසේ ම කෙරෙනු ඇතැ යි සෙනෙට් සභික කෙරී මෑතක දී කල ප්‍රකාශය මගින් සුන්කර දමනු ලබන තර්කයක් නම් බුෂ්පාලනය නියෝජනය කරන්නේ ඇමරිකානු විදේශ පිලිවෙතේ වඩාත් අසංවර වූ ද, මධ්‍යස්ථ මාවතකින් කිසියම් වර්ගයක අහම්බ අවමංගත වීමක් ය යන තර්කය ය.

බුෂ් පරිපාලනය සිය ප්‍රතිපත්ති යුක්තියුක්ත කිරීම සඳහා 2001 සැප්තැම්බර් 11 හේ අවතාරයෙහි පිහිට නිමක් නැතිව පතයි. සත්තකින් ම ඇමරිකානු දේශපාලනයේ නූතන මිථ්‍යා ප්‍රබන්ධය තුල එම දිනයට අයත් වන්නේ පූජනීය ස්ථානයකි. “සැප්තැම්බර් 11න් පසුව” එහි සුපුරුදු වාක්‍යාංශය නම් “සියල්ල මෙසේ වී ය” යන්න යි. මෙම නියමය සූපරීක්ෂව සොයාබැලීමක් ඇරිය නො හැකි වූ “මුලු ලෝකයම පිලිගත් සත්‍යයක්” ලෙස සැලකේ.

එහෙත් සත්‍යය නම් එක්සත් ජනපදයේ ජාත්‍යන්තර මූලෝපාය තීන්දු කිරීමේ දී 9/11 සිද්ධීන් කවරකාර හෝ අතිමූලික ක්‍රියාකලාපයක් ඉටු නො කරන බව ය.

එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානය සහ ඉරාකය ආක්‍රමනය කරන බව ඇමරිකානු විදේශ පිලිවෙතෙහි තරමක දැනුමක් සහිත නිරීක්ෂකයෙකුට වුව ද 2001 සැප්තැම්බර් 11 පෙර, සැබැවින් ම 2001 ජනවාරියේ බුෂ් ජනාධිපති ලෙස ස්ථාපනය කිරීමට පෙර වුව අපේක්ෂා කල හැකිව තිබුනි. ප්‍රථම ගල්ෆ් යුද්ධය නිමා වූ තැන් පටන් සමස්ත ඇමරිකානු විදේශ පිලිවෙතම ගනත් බැලුවේ ඉරාක යුද්ධය යලි ඇරඹීමට ය.

එසේ ම 1990 ගනන් පුරා ඇමරිකානු ප්‍රතිපත්ති සම්පාදකයන් තුල අරක්ගෙන වැඩෙමින් තිබූ මධ්‍යම ආසියාවේ භූ මූලෝපායික හා ආර්ථික වැදගත්කම සම්බන්ධ කාරනය විසින් ඇෆ්ගනිස්ථාන ආක්‍රමනය අපේක්ෂා කරන ලදි. 1997 දී ද ග්‍රෑන්ඩ් චෙස්බෝඩ් නමින් පොතක් ලිවූ ජනාධිපති ජිමී කාටර්ගේ හිටපු ආරක්ෂක උපදේශක සිබිග්නිව් බ්‍රෙසින්ස්කි මධ්‍යම ආසියාව තුල බලාධිකාරවත් භූමිකාවක් අත්කර ගැනීම මත 21 වන සියවසේ ඇමරිකාවේ භූගෝලීය තත්වය රඳා පවතින බවට තර්ක කලේ ය. මධ්‍යම ආසියාව තුල දිග්ගැස්සුනු මිලිටරි පැටලීමක විශාල සමාජ පිරිවැය ඇමරිකානුවන් මත පැටවෙන බව සැලකිල්ලට ගනිමින් බ්‍රෙසින්ස්කි මෙසේ අනතුරු ඇඟවී ය. “රටෙහි යහ පැවැත්ම පිලිබඳ පොදු ජනතාවගේ හැඟීම්වලට එල්ලවන හදිසි තර්ජනයක හෝ අභියෝගයක කොන්දේසි යටතේ හැර” එවන් ක්‍රියාවන් සඳහා සහයෝගය රට තුලින් ලබාගැනීම දුෂ්කර වනු ඇත.”

සැප්තැම්බර් 11 සිද්ධිය ඇමරිකාවේ විදේශ ප්‍රතිපත්තිය යලි සූත්‍රගත කිරීමකට තුඩුදුන්නේ නැත. ජිමී කාටර්ගේ කාලය දක්වාම දිවෙන එක්සත් ජනපද පරිපාලනයන් විසින් සූත්‍රගත කල හා ක්‍රියාවට නැංවූ භූ මූලෝපායික අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා එය නිමිත්තක් සැපයුවා පමනි. සර්බියාවට එරෙහිව ජනාධිපති බිල් ක්ලින්ටන් විසින් 1999 දී දියත් කල යුද්ධය ද අමතක නො කරමින් බුෂ් පරිපාලන වකවානුව තුල දියත් කල යුද්ධයන්ට යටින් පවතින සාරභූත භූ මූලෝපායික අරමුනු යලි සඳහන් කර ගැනීම වටින්නේ ය.

1991 දී එසෝසස දියකර හල තැන් පටන් බලය හෙබවූ ජනාධිපති පරිපාලනයන් තුනෙහි ම (පලමුවැනි බුෂ්, ක්ලින්ටන් හා දෙවැනි බුෂ්) ප්‍රධාන අරමුන ව තිබුනේ සෝවියට් සංගමය බිඳවැටීමෙන් සම්පාදනය කෙරුනු ඓතිහාසික අවස්ථාව ගසාකෑමෙන් ලෝක කරලියේ දී එක්සත් ජනපදය සඳහා අනභියෝගී තත්වයක් ගොනඩගා ගැනීම යි. 1992 දී තරම් ඈත දී එක්සත් ජනපද මිලිටරිය නව මූලෝපායික ලියවිල්ලක් නිකුත් කලේ ය. එය නිවේදනය කලේ ලෝක කටයුතුවල දී එක්සත් ජනපදයේ අධිකාරවත් තත්වයට මිලිටරිමය හෝ ආර්ථිකමය අභියෝගයක් විය හැකි ඕනෑම රාජ්‍යයක්, ඉන් වලකාලීම ඇමරිකානු ප්‍රතිපත්තියේ එල්ලය වූ බව යි. මෙම ගෝලීය මූලෝපායේ සන්දර්භය තුල දැවැන්ත ස්වාභාවික ගෑස් හා තෙල් සංචිතවලින් පොහොසත් මැදපෙරදිග හා මධ්‍යම ආසියාවේ ආධිපත්‍යය පිහිටුවීම මගනොහැරිය හැකි පරම අවශ්‍යතාවක් විය. ලෝක පරිමානව හඳුනාගෙන ඇති සියලු ඉන්ධන සංචිතවලින් විශාල කොටසක් අඩංගුව ඇති මෙම නිධි කරා නිර්බාධිතව පිවිසීම හා ඒවා පාලනය එක්සත් ජනපදය සඳහා තීරනාත්මක වන්නේ එමගින් රටෙහි දේශීය බලශක්ති අවශ්‍යතාවන් සන්තර්පනය කිරීම සහතික කරන නිසා පමනක් නො වේ. ඉදිරි විසිපස් වසර තුල ක්ෂය වී යෑමට නියමිත ස්වාභාවික ගෑස් හා තෙල් නිධි සහිත ලෝකයක මෙම සංචිත බෙදාහැරීම හා පංගු

නිර්නය පාලනය කිරීම මගින් සියලුම වර්තමාන හා අනාගත තරගකරුවන්ගේ ඉරනම මත මාරාන්තික ග්‍රහනයක් පවත්වාගැනීමට එක්සත් ජනපදයට අවස්ථාව සලසා ගැනීම ය තීරනාත්මක කාරනය.

ලෝක කර්තව්‍යයන්හි දී ඇමරිකානු ආධිපත්‍යය පිහිටුවා ගැනීමේ හා තහවුරු කර ගැනීමේ අත්‍යවශ්‍ය මූලෝපායික එල්ලයන් සම්බන්ධව ජෝර්ජ් බුෂ් හා ජෝන් කෙරී අතර මූලික හෝ වැදගත් වෙනස්කමක් නො පවති යි. විසම්මුතීන් පවතින්නේ නම් ඒවා ප්‍රධාන වසයෙන් උපායික ස්වභාවයක් ගනී. එනම් සිය ආධිපත්‍ය ඉදිරියට ගෙනයාමේ දී කොතරම් ප්‍රමානයකින් කිසියම් වර්ගයක ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී රාමුවකට එක්සත් ජනපදය අනුගත වීමට සූදානම් ද යන කාරනය යි.

එහෙත් බුෂ්ගේ විදේශ පිලිවෙත ක්‍රියාවට නැගීම පිලිබඳව විවේචනශීලී වන්නන් පවා එක්සත් ජනපදයේ පරිපාලනයේ වෙනස්වීමක් එහි ඒකපාර්ශ්වික යොමුව අතිමූලික ලෙස සංශෝධනය නො කරන බව වටහාගෙන සිටිති. මහාචාර්ය ජී. ජෝන් අයිකෙන්බරි ලිවූ පරිදි,
"සීතල යුද්ධයේ අවසානයත් බලවත් භූ දේශපාලනික තරගකරුවන් නො සිටීමත් නිසා ඒකපාර්ශ්විකත්වයේ න්‍යායවාදීන්ට අනුව දැන් එක්සත් ජනපදයට විශාල වියදමකින් තොරව තනිවම ක්‍රියා කිරීමේ හැකියාව ඇත. ඔවුන් නිවැරදි නම් ජාත්‍යන්තර ක්‍රියා පිලිවෙල පසු වන්නේ, අතීත යුගයේ දී ඒක පාර්ශ්විකත්වයට පැනවී තිබුනු සීමාබන්ධනයන් මුදා හැරීමට එක්සත් ජනපදය විසින් දරන අධිෂ්ඨානශීලී හා නිරන්තර උත්සාහයෙන් උත්තේජනය කල වැදගත් පරිවර්තනයක මුල් අවධියේ ය. *ආන්ඩුව කරවන්නේ කුමන දේශපාලන පක්ෂයක් ද, ජනාධිපති කවරෙක් ද යන්න දැන් අදාලවන්නේ සුලු වසයෙනි. එක්සත් ජනපදය එය සතු බලය වඩා ඍජු ලෙස ක්‍රියාත්මක කරයි. ජාත්‍යන්තර නීතිවල, ආයතනවල හෝ සන්ධානයන්ගේ මැදිහත්වීමෙන් හෝ බලපෑම්වලින් බැඳී ඇත්තේ මඳ වසයෙනි.* ප්‍රතිඵලය වනු ඇත්තේ අධිපතිවාදී බල පදනමකින් යුත් ජාත්‍යන්තර ක්‍රියා පිලිවෙලකි. අවශේෂ ලෝකය පැමිනිලි කරනු ඇත. එහෙත් එක්සත් ජනපදයේ වර්ධනය වන දිශානතිය වෙනස් කරන ලෙස ඒ මත සැලකිය යුතු බලයක් යෙදීමට අනෙකුත් ජාතීන් අකමැති හෝ අසමත් වනු ඇත." (අවධාරනය ඇඳින.)1

බුෂ් පරිපාලනයේ ඒකපාර්ශ්විකවාදය ගැන ඔහුගේ ඇල්මැරුනු විවේචන තිබුනේ වී නමුත් කෙරී නො කඩවා ම අවධාරනය කරන්නේ "ජාතික අවශ්‍යතාවය" ක දී අවශ්‍ය යයි සලකන්නේ නම් ඔහුගේ පරිපාලනය ඒකපාර්ශ්වික ව ක්‍රියාකිරීමට නො පැකිලෙන බව යි. මෙය සැලකිල්ලට ගන්නා විට නිසැකයෙන් ම ඉහත නිගමනය නිවැරදි ය.

අයිකෙන්බරි ඒකපාර්ශ්විකවාදය දෙසට වේගවත් වන ප්‍රවනතාවය ගැන වැලපෙන්නේ වී නමුත් මෙම වර්ධනයට හේතුව පැහැදිලි කිරීමට ඔහු අසමත් වෙයි. අනෙකුත් සියලු ජාතික රාජ්‍යයන් ඉක්මවා එක්සත් ජනපදය දරා සිටින දැවැන්ත මිලිටරි සුපිරි බව යලි යලිත් අවධාරනය කරන ඔහු මෙම සාරභූත භූ දේශපාලන සාධකය තමන් අනුගමනය කිරීමට තීරනය කරන කවරාකාර ප්‍රතිපත්තීන්ට හෝ එරෙහි ජාත්‍යන්තර විරෝධය තම අභිමතය පරිදි නොතකා හැරීමට එක්සත් ජනපදයට ඉඩ සලසන බව පෙන්වා දෙයි. එහෙත් මෙම පැහැදිලි කිරීම නො සෑහෙයි. දෙවැනි ලෝක යුද්ධය අවසන් වූ වහාම, එක්සත් ජනපදයේ මිලිටරි හා ආර්ථික ආධිපත්‍යය මුදුන්පත් වූ අවස්ථාවේ දී ටෲමන් පරිපාලනය නිමග්නව සිටියේ ජාත්‍යන්තර බහු පාර්ශ්වික ව්‍යූහ සංකීර්නයක් නිර්මානය කර ගැනීමේ ය.

දෙවැනි ලෝක යුද්ධය අවසන් වූ කල්හි ජාත්‍යන්තර ධනවාදයේ ව්‍යූහය තුල එක්සත් ජනපදයේ ආධිපත්‍යය වැඩිමනත්ව කරන ලද්දේ මිලිටරි බලය මගින් නො ව එම අවස්ථාවේ දී එක්සත් ජනපදය සතු වූ දැවැන්ත හා අනභියෝගී ආර්ථික ආධිපාත්‍යය විසිනි. ඇමරිකානු බලයේ සුපිරි සංකේතය වූයේ පරමානු බෝම්බය නො ව ඩොලරය යි. ජාත්‍යන්තර මූල්‍යයේ හා වෙලඳාමේ සමස්ත ව්‍යූහය ම රඳා පැවැත්තේ ජාත්‍යන්තර මුදල් සංචිතය ලෙස ක්‍රියාත්මක වූ ඩොලරය මත ය. ඩොලරය රන් අවුන්සයකට ඩොලර් 35 අනුපාතයට හුවමාරු කල හැකි විය. එක්සත් ජනපදයේ දැවැන්ත මූල්‍ය හා කාර්මික බලය ලෝක ආර්ථිකයේ යෝධ ප්‍රසාරනයකට අත්‍යවශ්‍ය සම්පත් සම්පාදනය කලේ ය.

අද ලෝක තත්වය දෙවැනි ලෝක යුද්ධාවසානයේ පැවතියාට වඩා සාතිශයව ම වෙනස් ය. එක්සත් ජනපදයේ භූගෝලීය ආර්ථික තත්වය පසු ගිය දශක හය තුල නාටකීයව දුබල වී ඇත. 1971 වන විට පවා ප්‍රධාන ධනේශ්වර පිලිමලුන් වූ යුරෝපය හා ජපානය සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ සාපේක්ෂ දුබලවීම බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය ද එහි අඩිතාලම වූ ඩොලර් හා රන් හුවමාරු හැකියාව ද බිඳදැමීමට මග සැලසී ය. ඉන්පසු දශකවල දී එක්සත් ජනපදය ලෝකයේ නය හිමියාගේ සිට මහම නය ගැතියා බවට පරිවර්තනය වී සිටී. වසර හැටකට පෙර යුද්ධය හා අවපාතය මගින් කැබලිති කර තිබූ ලෝක ධනේශ්වර පර්යාය යලි ගොඩනැගීමට ඉන්ධන සැපයුවේ ඇමරිකානු කාර්මික හා මූල්‍ය බලය යි. අද ඇමරිකානු මූල්‍ය බලයේ ශක්‍යතාව රඳාපවත්නේ විදේශ රටවල් හා ආයෝජකයන් එක්සත් ජනපදයේ කඳු ගැසෙන ජංගම ගිනුම් හිඟය පියවීමට දක්වන කැමැත්ත මත ය.

සිය ප්‍රසාරනය වන ජංගම ගිනුමේ හිඟය පියවාගැනීම සඳහා එක්සත් ජනපදය දැන් දලවසයෙන් වසරකට ඩොලර් බිලියන 540ක් නයට ගනියි. (එනම් දිනකට ඩොලර් බිලියන 1 1/2කි - (පරිවර්තක). මෙය 2004 ප්‍රථම කාර්තුව තුල දල දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි.) සියයට 5.4ක අගයකි. මෙය ඩොලරයේ අගය තුනෙන් එකකටත් වැඩි ප්‍රමානයකින් පහල වැටුනු හා

කොටස් වෙලඳ පොල බිඳ වැටුනු 1987 දී වාර්තාගත වූ සියයට 3.5 උපරිමය ද ඉක්මවා සිටී.

වෙලඳ ශේෂයේ උපුටන අගයෙහි විශාලතම සංරචකය වන ජංගම ගිනුමේ හිඟය බරපතල අර්බුදයකට නැඹුරු වී තිබෙන බවට පොදු එකඟතාවක් ධනේශ්වර ආර්ථික විද්‍යාඥයන් අතර පවතියි. ජාත්‍යන්තර අස්ථායිකාරක ප්‍රතිවිපාකයන් ඇතිවන පරිදි ඩොලරයේ විශාල පහල වැටීමක් අවශ්‍ය යයි ද නො වැලැක්විය හැකි යයි ද බොහෝ දෙනෙක් අපේක්ෂා කරති. විදේශ සම්බන්ධතා මන්ඩලයේ සභාපති පීටර් ජී. පීටර්සන්ට අනුව,

"ඩොලරයේ මීලඟ කඩාවැටීමක් සිදුවුව හොත්, පාරිභෝගික හා ආයෝජන විශ්වාසය නැතිවීම, බරපතල ආර්ථික හැකිලීමක් හා අවසාන වසයෙන් ගෝලීය පසුබෑමක් ඇතුලත් දැඩි දෝංකාරයක් ජනිත කරනු ඇත."

මෙම කතුවරයා (පීටර්සන්) විසින් විමසන ලද ප්‍රතිපත්ති සම්පාදකයන්, මූල්‍ය වෙලෙන්දන් හා ආර්ථික විද්‍යාඥයන් කිසිවෙකු හෝ එක්සත් ජනපදයේ ජංගම ගිනුමේ හිඟයේ වත්මන් මට්ටම් තවත් අවුරුදු පහකට වඩා දරාගෙන සිටිය හැකි යයි විශ්වාස නො කරති. බොහෝ දෙනෙක් අර්බුදයක සැබෑ අන්තරාය වටහා ගනිති. හිටපු ෆෙඩරල් රිසර්ව් (ඇමරිකානු මධ්‍යම) බැංකු සභාපති පෝල් වෝකර් කියන්නේ එලඹෙන පස් වසර තුල මෙය සිදු වීමට ඇති ඔට්ටු ඉඩ සියයට 75ක් බව යි. හිටපු භාන්ඩාගාර ලේකම් රොබට් රූබින් "බැරෑරුම් පව් ගෙවන දිනයක්" ගැන කතාකරයි. "එවන් අර්බුදයක් කුලුගන්වන්නේ කුමක් විසින් ද?" සමස්ත වසයෙන් ඕනෑම දෙයක්, එනම් ත්‍රස්තවාදී ක්‍රියාවක්, වෝල් වීදියට නරක දිනයක්, බලාපොරොත්තු සුන් කරන රැකියා වාර්තාවක් හෝ මධ්‍යම බැංකුකරුවකුගේ නුරුස්නා මත ප්‍රකාශයක්" එවැන්නකට තුඩු දෙනු ඇත.[2]

*ෆිනෑන්ෂල් ටයිම්ස්* හි නම් දැරූ ආර්ථික විශ්ලේෂක මාටින් වොල්ෆ් එක එල්ලේම තත්වය විස්තර කරයි. "එක්සත් ජනපදය දැන් විනාශයේ පහසු මාවතකට පිවිස සිටී. එය ධාවනය කරමින් සිටින්නේ සැමදා ඉහල යන අභ්‍යන්තර හා බාහිර හිඟයන්ගෙන් ද නයෙන් ද එරට මුදලේ භූගෝලීය භූමිකාව හා තත්වය විනාශවීමේ අවදානම් පාරක ය. ඒ සමගම එක්සත් ජනපදයේ ආරක්ෂනවාදයේ පාලනය කල නො හැකි වර්ධනයක් එමගින් ජනනය කල හැකි වීම අහම්බයක් නො වේ. වඩාත් නපුරු කාරනය නම් මේ ක්‍රියාවලිය දිග් ගැසුනු තරමට ඩොලරය මතට ද දේශීය වියදම් මට්ටම් කෙරෙහි ද යෙදෙන අන්තිම කම්පනය එපමනට ම විශාල වීම වඩාත් අගුන වනු ඇත. ප්‍රවනතාවන් වෙනස් නොවුන හොත් වසර දහයක දී එක්සත් ජනපද මූල්‍ය වගකීම් හා නය යන එකිනෙකත් දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට සියයක් වනු ඇත. සිය ආර්ථික ඉරනම මත පාලනය එයට අහිමි වනු ඇත."[3]

තමන්ගේ පිරිහෙන භූ ගෝලීය ආර්ථික තත්වය පිලිබඳ වැටහීම එක්සත් ජනපදයේ වැඩිවැඩියෙන් මිලිටරි බලය මත වාරු වීමට මෙහෙයවන්නා වූ වැදගත් සාධකයකි. එහෙත් ඇමරිකාවේ බොහෝ ඈත රටවල මිලිටරි මෙහෙයුම්වල දැවැන්ත පිරිවැය පරස්වාවක ලෙස ජාතික ආර්ථිකය මත බර පැටවෙන තවත් ප්‍රධාන බාධකයක් වෙයි. ඉරාක මෙහෙයුම එවන් එක් අවස්ථාවකි. "ස්ථායීකාරක මෙහෙයුම්" වල යෙදී සිටින සේනාංක දෙකක් නඩත්තු කිරීමට පමනක් එක්සත් ජනපදයට සෑම සතියකට ම ඩොලර් බිලියනයක් වැයවේ. එක් වර්ෂයක් යොදවා තැබීමට නවසීලන්තයේ මුලු ද.දේ.නි. ම වැයවනු ඇත.[4] ඉරාක යුද්ධයට යන වියදම දැනට මත් මිලිටරි වැය සඳහා වෙන් කර ඇති මුදලට අමතර ය. කොන්ග්‍රස් අයවැය කාර්යාලයේ මෑත ගනන්බැලීම්වලට අනුව පෙනී යන්නේ ඉදිරි දස අවුරුද්ද වෙනුවෙන් මිලිටරි යෙදවුම් අරමුදලට අවශ්‍ය මුදල් ප්‍රමානය බුෂ් පරිපාලනය විසින් බරපතලව අවතක්සේරු කර ඇති බව ය. අලුත් වියදම් පියවීම සඳහා අතිරේක ඩොලර් ට්‍රිලියන 1.1ක් වෙන්කල යුතුව ඇත.[5]

ඇමරිකානු මිලිටරිවාදයේ වියදම් මගින් ජනිත කර ඇති මූල්‍ය පීඩනයන්ටත් වඩා වැදගත් වන්නේ අන්තර් අධිරාජ්‍යවාදී හා අන්තර් රාජ්‍ය සම්බන්ධතා මත ඉන් ඇති කරන්නා වූ විභව පුපුරනසුලු බලපෑම යි. ලෝක ආධිපත්‍ය සඳහා එක්සත් ජනපදයේ ධාවනය සිදුවන්නේ භූදේශපාලනික රික්තයක් තුල නො වේ. එක්සත් ජනපදයේ අභිලාෂයන් අනෙකුත් රාජ්‍යයන්ගේ වැදගත් අවශ්‍යතාවන් සමග සට්ටනය වනතාක් දුරට ප්‍රතිමුඛතාවය හා සට්ටනය මගහැරිය නො හැකි ය.

ඉරාක ආක්‍රමනයට ලකලෑස්ති වීමේ කාලය තුල එක්සත් ජනපදය හා යුරෝපය අතර ඇති වූ රොස්පරොස්කම් පිලිබිඹු කලේ ද්‍රව්‍යමය අවශ්‍යතාවන් පිලිබඳ සැබෑ ගැටුම් ය. යම් අවස්ථාවක දී මෙම ආරාවුල් තියුනු රාජ්‍යතාන්ත්‍රික වචන හුවමාරුවලට වැඩි මට්ටමකට යොමුවිය හැකි ය. අවසානයේ දී "පැරනි යුරෝපය" සිය තොල සපාගෙන එක්සත් ජනපදය ඉරාකය ආක්‍රමනය කරද්දී දුර්මුඛව බලා සිටියේ ය. එහෙත් එක්සත් ජනපද නව තෙල් සම්පත් සොයා යාමේ දී යුරෝපය අප්‍රිකාවෙන් පසෙකට තල්ලු කරන ආකාරය යුරෝපය දිගින් දිගට එලෙස ම බලාසිටියි ද? 2002 ජුලි මාසයේ නයිජීරියානු සංචාරයක දී සහකාර රාජ්‍ය ලේකම් වෝල්ටර් කැන්ස්ටයිනර් ප්‍රකාශ කලේ "අප්‍රිකානු තෙල් අපට ජාතික මූලෝපායික අවශ්‍යතාවක්" බව යි. එක්සත් ජනපද බලශක්ති ප්‍රතිපත්තියට තීරනාත්මකව වැදගත් වන අප්‍රිකානු තෙල් නිෂ්පාදක රටවල සය දෙනෙකු බුෂ් පරිපාලනය විසින් නම් නියම කරගෙන තිබේ. නයිජීරියාව, ඇන්ගෝලාව, ගැබෝන්, කොංගෝ සමූහාන්ඩුව, චැඩ් හා නිරක්ෂ රේඛායික ගිනියාව, (පසුව කී රාජ්‍යය ඉලක්ක කර ගත් කුමන්ත්‍රනයක් සැලසුම් කලේ සුප්‍රකට හිටපු බ්‍රිතාන්‍ය අගමැතිගේ පුත් ශ්‍රීමත් මාක් තැචර් මිස වෙන කිසිවෙකු නො වේ.) එම මහාද්වීපයේ එක්සත් ජනපද මිලිටරි කටයුතු සම්බන්ධීකරනය සඳහා නව අප්‍රිකානු අනදෙන මධ්‍යස්ථානයක් පිහිටුවීම ගැන එක්සත් ජනපද ආරක්ෂක

දෙපාර්තමේන්තුව තුල දැන් සාකච්ඡා පැවැත්වේ.6

පැරනි අධිරාජ්‍යවාදී සතුරන් සමග ඇතිවිය හැකි ගැටුම්වලට අමතරව පසු ගිය පස්වසර තුල මධ්‍යම ආසියාව තුලට ඇමරිකාවේ කඩාවැදීම, එම ප්‍රදේශයේ අනාගතය ගැන ප්‍රධාන වසයෙන් උත්සුකවන ඉරානය, ඉන්දියාව, චීනය හා රුසියාව ඇතුලු අනෙකුත් සියලුම රාජ්‍යයන් සමග මිලිටරි ගැටුමක විභවය ඉහල නංවයි.

ධවල මන්දිරය රාජ්‍ය දෙපාර්තමේන්තුව හා පෙන්ටගනය තුල පුද්ගල වෙනසක් මගින් ඇමරිකානු විදේශ පිලිවෙතේ නිශ්චිත අංගයන්ට බලපෑමක් ඇතිවිය හැකි ය යන්නට අප මඳක් ඉඩ හැරියොත් සමහරවිට කෙරී පරිපාලනයක් එක් හෝ තවත් මිලිටරි ක්‍රියාවක් සඳහා සිය අධිරාජ්‍යවාදී සගයන්ගේ අනුමැතිය දිනාගැනීමේ බලවත් උත්සාහයක යෙදෙනවා විය හැක. එහෙත් එවන් වෙනස්කම් ප්‍රතිපත්ති විෂයයෙහි නො ව ඇත්තේ ශෛලියේ ය. අධිරාජ්‍යවාදී වූ ලෝක පර්යායක සැකිල්ල තුල ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතර අතිමූලික විසම්මුතිය සාමකාමීව කලමනාකරනය කල නො හැක. 1930 හා 1940 ගනන්වල ජර්මානු අධිරාජ්‍යවාදය මෙන් ම ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ආක්‍රමනශීලි හා ප්‍රචන්ඩ ලක්ෂනය අධිරාජ්‍යවාදී ක්‍රමයේ අවශ්‍යයෙන් ම කොල්ලකාරී ස්වභාවයේ වඩාත් ම ආන්තික ප්‍රකාශනය පමනි.

1940 මැයි මාසයේ හිට්ලර්ගේ හමුදාවන් ප්‍රන්සය පීරාගෙන ගමන් ගනිද්දී යුද්ධය පුපුරායාම පිලිබඳ ලාභ අර්ථකථන ලියොන් ට්‍රොට්ස්කි ප්‍රතික්ෂේප කලේ ය. "වර්තමාන යුද්ධය - දෙවැනි අධිරාජ්‍යවාදී යුද්ධය - අහම්බයක් නො වේ." යයි ඔහු ලිවී ය. "එය ඒ හෝ මේ ආඥාපතියාගේ කැමැත්තෙහි ප්‍රතිඵලය නො වේ. කාලයකට පෙර එය පෙර දැක එහි සම්භවය පවත්නේ ජාත්‍යන්තර ධනේශ්වර අවශ්‍යතාවන්ගේ විසම්මුතීන් ලෙස ජනතාව මත්කිරීමට සැලසුම් කල නිල මිථ්‍යා ප්‍රබන්ධයන්ට පටහැනිව අනෙකුත් සියලු සමාජ නපුර - විරැකියාව ඉහල ජීවන වියදම, ෆැසිස්ට්වාදය, විජිතවාදී පීඩනය යනාදිය - මෙන් ම යුද්ධයට ද හේතුව නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතිය සමග එක් වූ එම පදනම මත රඳා පවතින ධනේශ්වර රාජ්‍ය යි. සමාජයේ ප්‍රධාන නිෂ්පාදන බලවේග මහා සංග, එනම් වෙන්වෙන් ධනපති කල්ලි අත තිබිය දී ජාතික රාජ්‍යය මෙම කල්ලි අත නම්‍යශීලි උපකරනයක් වන හෙයින් වෙලඳ පොල සඳහා ද, අමුද්‍රව්‍ය මූලාශ්‍රයන් සඳහා ද, ලෝකාධිපත්‍යය සඳහා ද අරගලය වඩ වඩාත් විනාශකාරී ස්වභාවයක්, ගැනීම වැලැක්විය නො හැකි ය."7

මෙම වචන අදට කොතරම් නම් ඔබී ද, කාලානුරූප ද, දූරදර්ශී ද? ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ප්‍රතිපත්ති හැඩගන්වන හා තීරනය කරන විශාල හා බලගතු ආර්ථික බලවේගයන් වොෂින්ටනයේ හුදු පුද්ගල මාරුවකින් සංශෝධනය කෙරෙනු නැත. එක්සත් ජනපදයේ භූගෝලීය අභිලාෂයන් කෙතරම් හොඳින් සාක්ෂාත් වේ ද යන්න ගැන බුෂ් හා කෙරී අතර විවාදය, ජාතික ධනයෙන් විශාල කුට්ටියක් හිමි කර ගත් ඇමරිකානු සමාජයේ කුඩා කොටසක් වන පාලක ප්‍රභූව ඇතුලත කෙරීගෙන යන එකකි. බහුතරයක්, යුද්ධයට විරුද්ධව සිටින සාමාන්‍ය වැඩ කරන පන්තියේ ඇමරිකානුන් දශලක්ෂ ගනනකගේ උවමනාකම්, අධිරාජ්‍යවාදී පක්ෂ ජෝඩුවේ නිල උද්ඝෝෂන තුල කිසිදු අව්‍යාජ ප්‍රකාශනයක් පරම වසයෙන් අත් කර නො ගනී.

ඇමරිකානු පිලිවෙතේ දිශානතිය බුෂ් වෙනුවට කෙරී ආදේශ කිරීමෙන් සැලකිය යුතු ලෙස වෙනස් වේ යයි සිතීම ඉමහත් ශෝචනීය මිථ්‍යාවන් තුල සතුට පැතීමකි. එහෙත් තමන් "වමේ" යයි සලකන අය අතර එවන් මිථ්‍යාවන් හිඟ නැති බව පෙනී යයි. තරික් අලි මහතා නිදසුනකි - කෙරීට ඡන්දය දිය යුතු යයි කියා සිටින තවමත් තමන් සමාජවාදියෙකු යයි විස්තර කරගන්නා මොහු 1960 හා 1970 ගනන්වල දී බ්‍රිතාන්‍යයේ ජාත්‍යන්තර මාක්ස්වාදී කන්ඩායමේ ප්‍රමුඛයන් අතර විය. දේශපාලන විශ්ලේෂකයකු වසයෙන් තරික් අලි මහතාගේ වාර්තාව විශ්වාසය, දල්වන්නක් නො වේ. පෙරෙස්ත්‍රොයිකා හා ග්ලාස්නොස්ට් වැඩපිලිවෙල සෝවියට් සංගමය තුල සමාජවාදය සඳහා ශ්‍රේෂ්ඨ ඉදිරි පියවරක් ලෙස උද්යෝගිමත්ව හුවා දැක්වූ, තරික් අලි 1980 ගනන් පසු භාගයේ දී තමා විසින් මෙම මාතෘකාව ගැන රචනා කල කෘතිය කැප කලේ අන් කිසිවෙකුට නො ව බෝරිස් යෙල්ට්සින්ට ය: "ඔහුගේ (යෙල්ට්සින්ගේ) දේශපාලන ධෛර්යය ඔහු රටපුරා වැදගත් සංකේතයක් බවට පත් කර තිබේ." යයි තරික් අලි ලියා තැබී ය. එහෙත් අප අතීතය මත රැඳී නො සිට ඇමරිකානු මැතිවරනය ගැන දැන් තරික් අලිට කීමට ඇත්තේ මොනවා දැයි හැරී බලමු.

අගෝස්තු 5 දා නිව්යෝක් නගරයේ *එන්බීඒඅයි* ගුවන් විදුලියේ සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වූ තරික් අලි බුෂ්ගේ පරාජය පිටරටවලට ධනාත්මක පනිවිඩයක් යවනු ඇතැයි අවධාරනය කලේ ය. "යුදකාමී ආන්ඩුවක පරාජය ඉදිරි පියවරක් ලෙස දැකගනු ඇතැ"යි ඔහු කීවේ ය. "මම ඉන් ඔබ්බට නො යන්නෙමි. එහෙත් එය ලෝකව්‍යාප්ත බලපෑමක් වනු ඇතැ යි යන්න ගැන මගේ සිතේ කිසිදු සැකයක් නැත."

කෙරී තේරී පත්වීම ඉදිරි පියවරක් විය යුත්තේ කුමන අර්ථයකින් ද? මෙම වර්ධනයේ භූගෝලීය බලපෑම කුමක් විය යුතු ද? ඉන්පසු එක්සත් ජනපද හමුදා ඉරාකයෙන් ආපසු කැඳවනු ලබයි ද? ඇෆ්ගනිස්ථානයෙන් එක්සත් ජනපද හමුදා ඉවත් කිරීමක් කෙරේ ද? මෙම ප්‍රශ්නවලට ඒකාන්ත පිලිතුර කිසිසේත් ම 'නැත' යන්න ය. බුෂ්ගේ පරාජයෙහි ගෝලීය බලපෑම ඉරාක මිලිටරි පාලනය පවත්වාගෙන යාම සඳහා ද දැනට පිඹුරුපත් සැකසෙමින් පවත්නා අනෙකුත් මිලිටරි ක්‍රියාවන් සඳහා ද යුරෝපීය සහයෝගය දිනාගැනීමට එක්සත් ජනපදය විසින් දරන උත්සාහයට හොඳ ආධාරයක් විය හැකි ය. ඇත්ත වසයෙන් ම මෙම තර්කය නයෝමි ක්ලේන් වනාහි

පාලක ප්‍රභූවේ බලපෑම් සහගත කොටස්වල සහයෝගය තමාගේ අපේක්ෂකත්වය පිටුපස ගොනුකර ගැනීම සඳහා යොදා ගැනීමට උත්සාහ දැරීමේ දී කෙරී යොදාගන්නා එකකි.

කෙරීට සහයෝගය දීම සඳහා තවත් තර්කයක්, *ද නේෂන්* පුවත්පතෙහි අගෝස්තු 16 කලාපයේ පල විය. තමන් අවසානයේ දී "බුෂ් හැර ඕනෑ එකෙක්" කඳවුරට ගාල් වූයේ ඇයි ද යන්න පිලිබඳ මෙම නවතම තර්කය නයෝමි ක්ලේන් ඉදිරිපත් කලා ය. "ප්‍රගතිශීලීන්"ගේ දැඩි වෛරයට පාත්‍ර වූ බුෂ් ජනාධිපතිව සිටින තාක් දුරට ඔවුන්ට සමාජයේ පොදු අර්බුදය ගැන ද යුද්ධයේ ගැඹුරු හේතු සාධක ගැන ද හා දේශපාලනය ගැන බැරෑරුම්ව සිතීමට නො හැකිව තිබේ.

"මෙම පිස්සුව නතර විය යුතු ය." ඇය ලිය යි. "එය ඉටු කර ගැනීමට වේගවත්ම මග වන්නේ කෙරී තෝරා ගැනීම ය. කෙරී බුෂ්ට වඩා වෙනස් නිසා නො වේ. වෙනත් මූලික අංශවල දී, ඉරාකය, මත්ද්‍රව්‍ය විරෝධී සංග්‍රාමය, ඊශ්‍රායලය හා පලස්තීනය, නිදහස් වෙලඳාම, ව්‍යාපාරික බදු, (යනාදී මේ සියල්ලේ දී) කෙරී ද බුෂ් තරම් මැ නරක ය. මොවු'නතර ප්‍රධාන වෙනස වනවා ඇත්තේ කෙරී මෙම පිලිවෙත් ක්‍රියාත්මක කරන අතරතුරේ දී, වඩාත් බුද්ධිමත්, සිහි කල්පනා සහගත සහ සැනසුම්දායක ලෙස තේජසින් තොර වන බැවිනි. 'බුෂ් හැර ඕන එකෙක්' කඳවුරේ මා සිටින්නේ ඒ නිසා ය. ජනාධිපතිට වෛර කිරීමේ ව්‍යාධියෙන් අත්මිදී අන්තිමේ දී යලිත් කරුනු කාරනාවලට අවධානය යොමු කිරීම ඉටු කරගත හැක්කේ කෙරී වැනි කැපී නො පෙනෙන කෙනෙකු අතට සුක්කානම දුන්නොත් පමනකි.

එවන් තර්කයකට පිලිතුරක් දීම පවා වටී ද? තම සියලු මිතුරන් ඔවුන්ගේ ඔලුගෙඩි නැතිකරගත් බව සොයා ගැනීමෙන් පසුව ක්ලේ මහත්මිය ද ඔලුව ගලවා ගනිමින් ඔවුන්ගේ සමාගමට බැඳෙන්ට තීරනය කර තිබේ.

තරික් අලි හා නයෝමි ක්ලේන්ස් විසින් කරනු ලබන දේශපාලනයේ ස්වභාවය ගැබ්කර දක්වන පදයක් තිබේ. එනම් *අවස්ථාවාදය* යි. ඉන් අප අදහස් කරන්නේ ප්‍රධාන දේශපාලනයේ දී මූලධර්මාත්මක ප්‍රශ්න තත්කාර්යවාදී හා තනිකරම උපායාත්මක ගනන්බැලීම්වලට යටත් කිරීම යි. න්‍යාය හා ඉතිහාසය කෙරෙහි උදාසීන (ඔවුන් මෙය හුදු "වියුක්තයක්" සේ බැහැර කරති.) වන අවස්ථාවාදීහු පුරුද්දක් වසයෙන් දේශපාලන වර්ධනයේ දුෂ්කර ගැටලු මගහරිති. කම්කරු පන්තිය ස්වාධීනව දේශපාලනමයව සංවිධාන කිරීමේ දී සමාජවාදී පන්ති සවිඥානකත්වයේ ද ආස්ථානයෙහි සිට, සිය උපායාත්මක වට්ටෝරුවල ඇඟවුම් විග්‍රහ කොට පැහැදිලි කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම ගැන, තමන්ව විවේචනයට ලක් කරන මාක්ස්වාදීන් විසින්, අභියෝග කරන ලද කල්හි අවස්ථාවාදී ඔවුන්ගේ තත්කාර්යවාදී ප්‍රතිපත්තීන් යථාර්ථවාදී දේශපාලනයේ නාමයෙන් යුක්තිසහගත කරති. "මාක්ස්වාදී නුඹලා න්‍යායේ ලෝකය තුල ජීවත් වෙති." යි ඔවුහු කියති, "අප ජීවත්වන්නේ යථා ලෝකය තුල යි." දේශපාලනඥයින් අතර වඩාත් අයථාර්ථවත් වන්නේ තමන් බව සිතා ගැනීමට මෙම තත්කාර්යවාදී අවස්ථාවාදීහු සමත් නො වෙති. යථාර්ථය පිලිබඳ, ඔවුන්ගේ සංකල්පය පදනම්ව ඇත්තේ සිද්ධීන් උඩින් පල්ලෙන් තක්සේරු කිරීම, කෙටිකාලීන වාසි සඳහා ගනන්බැලීම් හා ස්වයං ප්‍රෝඩාවේ නොඅඩු බේත්වේලක් මත මිස පන්ති අරගලය හා එහි දේශපාලන ගතිකයන්හි නීති තුලට එබී බලන ඥානයක් මත නො වේ.

අවස්ථාවාදීන්ගේ අභිලාෂයන් කුමක් වුව ද කෙරීට සහයෝගය පිනිස ඔවුන් පෙරට ගෙන ආ සියලු තර්ක දායකවන්නේ කම්කරු පන්තිය දේශපාලනිකව මුලාකිරීමට ය. මැතිවරනය කවුරුන් දිනුවත් අනිවාර්‍යයෙන්ව එක්සත් ජනපදය තුල දැවැන්තව තීව්‍ර කෙරෙන්නා වූ දේශපාලන ආර්ථික හා සමාජ අර්බුදයට මැතිවරනයෙන් පසුව මුහුනපෑමට සිදුවන කල්හි කම්කරු පන්තිය ඒ සඳහා තරයේ ම නුසූදානම් තත්වයකට අවස්ථාවාදීන්ගේ තර්ක මගින් ඇද හෙලනු ලැබ තිබේ.

දශක ගනනාවක් දිගු ලිබරල්වාදයේ මරලතෝනි කාලය තුල ඩිමොක්‍රටික් පක්ෂයේ ආධිපත්‍යයෙන් නිදහස්වීමට කම්කරු පන්තිය අසමත්වීම පෙන්නුම් කරන්නේ ඓතිහාසික ඛේදවාචකයකි. පසු ගිය තිස්පස් වසර සාක්ෂි දරනුයේ නතර නො කල හැකි පරිදි ඩිමොක්‍රටික් පක්ෂය තව දුරටත් දකුනට විකාශනය වීම ය. කම්කරු පන්තියට ආයාචනය කිරීමේ ලා ඩිමොක්‍රටික් පක්ෂයට පදනම සැකසූ සමාජ ප්‍රතිසංස්කාරක ලිබරල්වාදයෙහි ද්‍රව්‍යමය පදනමට යටින් වල කපා ඇති ඇමරිකානු ධනවාදයේ ලෝක තත්වය දුබලවීම මෙම විකාශයට ප්‍රධාන කොට ම පදනම සපය යි.

ඩිමොක්‍රටික් පක්ෂය සම්ප්‍රදායිකව තම දේශපාලන නියෝජකයන් (විශේෂයෙන් ම නීතිඥයන්, සරසවි බුද්ධිජීවීන්, යනාදී) බඳවා ගෙන තිබෙන සවෘත්තික ඉහල මධ්‍යම පන්තිය සැලකිය යුතු අන්දමින් පොහොසත් කිරීම ද, ඇතුලත් වූ ඇමරිකානු සමාජයේ ව්‍යුහයේ මුඛ්‍ය වෙනස්කම් සමග බැඳුනු එක්සත් ජනපද ධනවාදයේ පොදු අර්බුදය ධනපති පන්තිය තුල හා එහි සමාජ වාටියේ ලිබරල් ප්‍රතිසංස්කරනවාදය සඳහා වූ ඡන්දදායකය මුලුමනින් ම පාහේ අහෝසි කර දමා තිබේ.

ඇමරිකානු ලිබරල්වාදයේ දේශපාලන කුනුවීම කෙතෙක් ද යත් ඩිමොක්‍රටික් පක්ෂය බුෂ් පරිපාලනයට එරෙහිව බැරෑරුම් දේශපාලන සටනක් ඇරඹීමට පවා අපොහොසත් විය.

කම්කරු ජනතාවගේ පලල් කොටස්වල යුද විරෝධී මනෝගතීන් ඇමතීමට එයට නො හැකි ය; එසේ නො කරනු ද ඇත. එහි අරමුන එහි සම්පූර්න අනෙක් පැත්ත ය: ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රධාන එල්ලය යුද්ධය කෙරේ දේශපාලන විරෝධය ප්‍රකාශනය වීම වැලැක්වීම ය. ඩිමොක්‍රටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා ලෙස ජෝන් කෙරී තේරීමට තුඩු දුන් ක්‍රියාවලිය අපි විමසා බලමු. 2003-2004 ගිම්හානයේ ඩිමොක්‍රටික් අපේක්ෂක

තේරීමේ ප්‍රාථමික වටයේ දී දේශපාලන ක්‍රියාකාරිත්වය ඇවිලවූ ප්‍රධාන ඉන්ධන වූයේ ඉරාක යුද්ධයට විරුද්ධත්වය බව සාර්වත්‍රිකව ම වටහා ගෙන තිබුනි. මත විමසුම් ඇඟවුම් කලේ තමන් ඩිමොක්‍රැටිකයන් ලෙස සලකාගත් ඡන්දදායකයන්ගෙන් දල වසයෙන් සියයට අසූවක් ඉරාක ආක්‍රමනයට විරෝධය පලකල බව යි. මෙය නිව් හැම්ෂයර්හි ආන්ඩුකාර හොවාඩ් ඩීන්ගේ ආරම්භක ජනප්‍රියත්වයට දායක විය. සෙනේට් සභික ජෝසප් ලිබර්මාන් හැරෙන්නට ඩිමොක්‍රැටික් ජනාධිපති නාමයෝජනා බලාපොරොත්තු වූ අන් සියලුම අපේක්ෂකයන් පුලුල්ව පැතිර තිබූ යුද විරෝධී මනෝගතියට අනුගත වූහ. ඉරාක ආක්‍රමනයටත් එරට මත මිලිටරි ආධිපත්‍ය පවත්වා ගැනීමටත් උඩගු ලෙස සිය සහයෝගය පලකල ලිබර්මාන් කිසිදු ප්‍රාන්ත ප්‍රාථමිකයක දී සියයට 7කට වැඩි ඡන්දයක් ලබා ගත්තේ ම නැත. මාස ගනනාවක් යනතෙක් ඩිමොක්‍රැටික් පක්ෂයේ නාමයෝජනා තරගයෙන් ඩීන් සැබවින් ම ජයගන්නා සෙයක් පෙනී ගියේ ය. මේ අතර ඔහුට රුදුරු ප්‍රහාරයක් එල්ල කල මාධ්‍ය ඔහු තෝරා ගැනීමට නුසුදුස්සෙක් ය යි නිවේදනය කලහ. මාධ්‍ය උද්ඝෝෂනය සාර්ථකවීමට හේතුව වූයේ නොවැම්බර් මැතිවරනයෙන් "සැබවින් ම ජයගත හැකි අපේක්ෂකයා" තෝරාගත යුතු යයි සාමාන්‍ය ඩිමොක්‍රටික් ඡන්දදායකයන්ට පැවති කැමැත්ත නිසා ය.

මේ වන තෙක් මොන ම තැනක් නැති බව පෙනී තිබුනු ජෝන් කෙරීගේ අපේක්ෂකත්වයේ හදිසි පනගැසීමකට මග පෑදුවේ මෙම මනෝගතිය යි. මාධ්‍යයන් සූක්ෂම හා අතිදක්ෂ උත්තේජනය මගින් අයෝවා හා නිව්හැම්ෂයර්හි - ප්‍රථම කන්ඩායම් රැස්වීම් හා ප්‍රාථමික තේරීම් වටය පැවැත් වූ මධ්‍යස්ථානයන් - ඡන්දදායකයන් කෙරී දැකගත්තේ ජාතික මැතිවරන ව්‍යාපාරයේ දී බුෂ් කන්ඩායම නිසැකව ම යොදාගනු ලබනු ඇති යුද උමතු මඩගැසීම්වලට ඔරොත්තු දෙන වර්ගයේ යුද වීරයෙක් ලෙස යි. කෙරී සිය පුරසාරම යුද විරෝධී මනෝගතියට ප්‍රවේශමෙන් අනුගත කරමින් ද සෙනේට් සභාවේ යුද යෝජනාවට පක්ෂව ඔහු දුන් ඡන්දය අඩු ලංසුවට දමමින් ද තමන් බුෂ්ගේ ඉරාක ප්‍රතිපත්තිවල විරුද්ධවාදියෙක් ලෙස පෙනීසිටින අතරවාරයේ ඩිමොක්‍රැටික් ඡන්දදායකයන් ඔහු වෙත හැරුනේ ජාතික මැතිවරනය ජයග්‍රහනය කල හැකි යුද විරෝධී අපේක්ෂකයා ඔහු බව සලකමිනි.

එය ඩිමොක්‍රැටික් පක්ෂය තුල ඉරාකය ආක්‍රමනය හා යුද්ධමය යටත්කර ගැනීමට විරුද්ධ සියලු සාකච්ඡාවන්හි අවසානය සලකුනු කලේ ය. ප්‍රාථමික වටයේ සියලු දේශපාලන ක්‍රියාකාරකම්වලට ඉන්ධන දුන් යුද්ධය පිලිබඳ ප්‍රශ්නය ප්‍රශ්නයක් නො වන තැනට පරිවර්තනය කෙරුනි. නිපුන උපාමාරු මගින් ඉරාක යුද්ධයේ මහජන විරෝධයට ජාතික මැතිවරන ව්‍යාපාරය විසින් වේදිකාවක් නො සපයන බවට පාලක ප්‍රභූව සහතික කරගති. සමස්ත යුදවිරෝධී ඡන්දදායකයේ ම ඡන්ද අයිතිය ක්‍රියාකාරී ලෙස අහෝසි විය.

මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලය පෙන්නුම් කරන්නේ එක්සත් ජනපදයේ නිල දේශපාලන පක්ෂ පලල් ජනතාවගෙන් මුලුමනින් ම වියෝ වී ඇති ප්‍රමානය යි. දේශපාලන බලය ධනපති පක්ෂ දෙක අත ඒකාග්‍රවීම ඇමරිකානු පාලක ප්‍රභූවෙන් සමන්විත ඉතා කුඩා සමාජ ස්ථරයක් තුල ජාතික ධනය ඒකරාශී වීමට අනුපූරකයක් වේ.


## එක්සත් ජනපදය තුල සමාජ ධ්‍රැවාන්තගතවීම හා ධන සමුච්චය

ඇමරිකානු සමාජයේ අතිශය වැදගත් අංගයක් වන ධනයේ සීමාන්තික ඒකාග්‍රවීමත්, ඊට අනුරූපී අසමානතාවයේ වර්ධනයත් පරීක්ෂා කිරීමෙන් තොරව එක්සත් ජනපදයේ දේශපාලන තත්වය වටහා ගැනීම අපහසු ය.


පසු ගිය ජූනියේ රොනල්ඩ් රේගන්ගේ අභාවය පාලක ප්‍රභූව තුල අසාමාන්‍ය ප්‍රතිචාරයක් ඇවිලවීය. සාමාන්‍ය ගෞරව දැක් වීමක භාවාතිශය මනෝගතියට බෙහෙවින් වැඩි දෙයක් රේගන් කෙරේ දැක් වුනු ඉතිරී යන බුහුමන් දැක් වීමට සම්බන්ධිතව තිබුනි. රේගන්ගේ මරනය, ඇමරිකානු සමාජය තුල පසු ගිය විසිපස් වසර පුරා ඇති වී තිබෙන වෙනස්කම් - 1980 රේගන් ජනාධිපති තනතුරට තේරී පත් වූ තැන් පටන් - ප්‍රතිබිම්බනය කරමින් තම සාමූහික ධනයේ දැවැන්ත රාශිභූතවීමට සැමරීමට සංස්ථාපිතයට අවස්ථාව සම්පාදනය කලේ ය.

මෙම විමසුමට උදව්වක් ලෙස මම ධනයේ ගොඩගැසීමත් සමාජ අවශ්‍යතාවයේ වැඩීයාමත් පැහැදිලි කරන ප්‍රස්තාර ගනනාවක් එක්රැස් කලෙමි.8 ඒවායින් අද පවත්නා අසමානතාවයේ සීමාන්තික මට්ටම් සනාථ කරනවා පමනක් නො වේ. මෙම සංඛ්‍යා ලේඛන පසු ගිය විසිපස් වසර තුල තීරනාත්මක දේශපාලන වර්ධනයන්ගේ සමාජ ආර්ථික පසුබිම තුලට එබී බැලීමටත් ඉඩකඩ සැලසෙ යි.

1 වැනි ප්‍රස්ථාරය 1947-1979 අතර පවුල් ආදායමේ වෙනස්වීම් අනාවරනය කරයි; දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ජනගහනයේ සියලු අංශවල පවුල් ආදායම් ඉහල නැංවූ ඇමරිකානු ආර්ථිකයේ දැවැන්ත ප්‍රසාරනය පෙන්නුම් කරයි. පවුල් ආදායම අනුව පහලම සියයට 20ට අයත් කොටසේ ආදායම සියයට 116න් ඉහල ගියේ ය. ඊට ඉහල සියයට 20 ආදායම සියයට 100න් ඉහල ගියේ ය. මැද සියයට 20 සියයට 114ක ඉහල යෑමක් අත්විඳි අතර ඊට ඉහල සියයට 20 සියයට 99ක් ද ඉහල ම සියයට 5 සියයට 86කින් ද ඉහල ගියේ ය. යුද්ධයෙන් පසුව ආර්ථික වර්ධනයේ ප්‍රතිඵලය වසයෙන් ජනගහනයේ සියලු කොටස් විශාල වාසි අත්කරගත් බවත් අවම වසයෙන් සියයට ගනන්වල අර්ථයෙන් ඉහලම ප්‍රතිලාභ ලබාගත්තේ ජනතාවගේ පහල සියයට 80 බවක් මත් අපට පෙන්නුම් කරයි.




දැන් අප 2 වැනි ප්‍රස්ථාරයට යොමු වෙමු. එය 1979-2001 අතර පවුල් ආදායමේ වෙනස් වීම සලකුනු කරයි.




කොතරම් අත්‍යසාමාන්‍ය වෙනසක් ද? පහල පවුල් සියයට අසූව ඉතා සීමිත ප්‍රතිලාභ හිමිකරගත් අතර ජනගහනයේ පොහොසත් ම කොටස හා විශේෂයෙන් ම ඉහල සියයට 5 පවුල් ආදායමේ විශාල වැඩිවීමක් දිගට ම අත් කර ගත්හ. පහල සියයට 20 පවුල් හිමි කර ගත්තේ සියයට තුනක ප්‍රතිලාභයකි. දෙවැනි සියයට 20 සියයට 11 ද මධ්‍යම පවුල් සියයට 20 සියයට 17ක් ද සිව්වැනි සියයට 20 සියයට 53ක් ද වර්ධනයන් ලැබූ අතර ඉහල ම සියයට 20 ආදායමේ සියයට 53ක වර්ධනයක් අත් කර ගත්හ. ඒ කොටසේ ඉහල ම සියයට 5 පවුල් සිය ආදායම සියයට 81කින් වර්ධනය කර ගති.


අප 3 වැනි ප්‍රස්ථාරය දෙස බලනතොත් බදු ගෙවීමකින් පසු පවුල් ආදායමේ වෙනස්වීම් සලකුනු කරන්නේ පවුල් ආදායමේ අසාමාන්‍යතාවය වඩා මත් කැපී පෙනෙන අයුරිනි. 1979-1997 අතර පතුලේ සියයට 20 පවුල් ආදායම සියයට 1කින් පහල වැටෙනු දැක ගත්හ. ඉහල ම සියයට 5 සියයට 157 වර්ධනයක් දැකගත්හ.

දැන් අප සිව්වැනි ප්‍රස්ථාරය දෙස බලමු. ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි) වැටුප සාමාන්‍ය කම්කරු වැටුපේ 1960-2001 අතර ගුනාකාරය ලෙස මෙයින් පෙන්නුම් කරයි. 1960 දී වාසනාවන්ත සමාගම් 100 ප්‍ර.වි.නි. වැටුපේ සාමාන්‍යය, සාමාන්‍ය ෆැක්ටරි කම්කරුවෙකුගේ වැටුප මෙන් 41 ගුනයකි. 1970 දී කොටස් වෙලඳ පොලේ විශාල ඉහල නැගීමක් හේතුවෙන් එය 79 ගුනයක් දක්වා වැඩි විය. 1970 ගනන් කොටස් මිල දැවැන්ත ලෙස පහල වැටීමට තුඩු දුන් සීමාන්තික ආර්ථික අර්බුදයේ දශකයක් වූ අතර ගුනාකාරය 42කට පහත වැටුනි. ඉන්පසු සිදු වූ දේ බලන්න. 1990 දී ප්‍ර.වි.නි. වැටුප සාමාන්‍ය කම්කරු වැටුප මෙන් 85 ගුනයකටත් 1996 දී 209 ගුනයකට හා 2000 දී එය 531 ගුනයකටත් ඉහල නැගුනි.

2001 එක්සත් ජනපදය තුල ධනය බෙදී ගිය ආකාරය 5 ප්‍රස්ථාරයෙන් පෙන්වයි. ජනගහනයෙන් පොහොසත් ම සියයට 1 ජාතික ධනයෙන් සියයට 33ක් පාලනය කරති. ඊලඟ සියයට 4 සියයට 26 හිමිකර ගනිති. ඊලඟ සියයට 5 සියයට 12ක් හිමිකර ගන්නා අතර සාමුහිකව පොහොසත් ම සියයට 10 ජාතික ධනයෙන් සියයට 71ක් හිමිකර ගනිති. මධ්‍යම සියයට 20 සියයට 4ක් පමනකි. ඊලඟ සියයට 22ට හිමිවන්නේ සියයට 0.3කි. පතුලේ ම සියයට 18ට ඇත්තේ 0 හෝ රින ශුද්ධ අගයකි.


6 ප්‍රස්ථාරය විශේෂයෙන් ම වැදගත් ය. ජනගහනයේ ඉහල ම සියයට 1 පාලනය කරන ජාතික ධනයේ පංගුවේ ඉහල පහල යාම විශ්ලේෂනය කිරීමේ දී පසු ගිය වසර 80හි ඇමරිකානු ඉතිහාසයේ සමාජ-පන්ති ගතිකයන්හි සැබෑ ගැඹුර දැකගත හැකි ය. එහි දුරස්ථ ලක්ෂයට 1929 දී එලඹීමෙන් පසුව පොහොසත් ම සියයට 1 පාලනය කරන ජාතික ධනයේ පංගුව 1930 ගනන්වල සැලකිය යුතු ලෙස පහල වැටුනේ මහා අවපාතයේ ප්‍රතිපල වසයෙනි. 1940, අගභාගයේ දී හා 1950 ගනන්වල දී එය ස්ථාවර වී වේගයෙන් ඉහල නැගුනු අතර 1960 ගනන්වල එය යම් ආකාරයේ වැඩි වේගයක් අත් කර ගත්තේ ය. ඉන්පසු 1970 ගනන්වල එය නාටකීය ලෙස කඩා වැටුනි. යම් ප්‍රමානයකට කම්කරු පන්තියේ අරගලයන් හරහා අත් කර ගත් ජයග්‍රහනයන් ද වඩා

**බදු ගෙවීමෙන් පසු පවුල් ආදායම වෙනස් වීම, 1979-1997**




ප්‍රස්ථාරය 3

**සාමාන්‍ය කම්කරුවකුගේ වැටුපේ ගුනිතයක් ලෙස සංගත ප්‍රධාන විධායක නිලධාරියකුගේ වැටුප, 1960-2001**




ප්‍රස්ථාරය 4

වැදගත් සාධකය වූ 1970 ගනන්වල ලෝක ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල වසයෙන් කොටස් මිල ගනන්වල විචිත්‍ර බිඳවැටීම ද මීට බලපෑවේ ය.

කොටස් මිලගනන්වල පහල වැටීම, උද්ධමනීය පසුබෑමේ (stagflation) නුහුරු සංයෝජනයක ප්‍රතිවිපාකයකි. එක්සත් ජනපද ආර්ථිකයේ නිෂ්පාදන අංශයේ ලාභදායකත්වය පහල වැටීම හා පාලක පන්තිය තුල පොදු විශ්වාසය නැති ව යෑම යි. ඇමරිකානු ධනේශ්වරය සිය සමාජ තත්වයේ පහත වැටීමට ප්‍රතිචාර දැක්වූයේ කම්කරු පන්තියට එරෙහිව ම්ලේච්ඡ ප්‍රති ප්‍රහාරයක් එල්ල කිරීම මගිනි.

1979 දී ඩිමොක්‍රැටික් ජනාධිපති කාටර් ෆෙඩරල් රිසව් බැංකුවේ සභාපති ලෙස පෝල් වෝකර් පත් කලේ ය. ඔහු පෙර නුවූ විරූ මට්ටම් කරා පොලී අනුපාතිකයන් ඉහල නැංවූ අතර එක්සත් ජනපද ආර්ථිකය පසුබෑමක ගිලී ගියේ ය.

මෙම ප්‍රතිපත්තියේ දැනුවත් එල්ලය වූයේ කම්කරු පන්තිය දුබල කිරීම සඳහා මහා විරෑ කියාවක් යොදාගැනීම, වෘත්තීය සමිතිවලට පහරදීම සඳහා ආන්ඩුවට හා සංගතවලට පහසුකම් සැලසීම හා ජීවන තත්වයන් පහල දැමීම ය.

ධනේශ්වරයේ ප්‍රතිපත්තිය ප්‍රමුඛ සඟරාවක් වන *බිස්නස් වීක්* හි මෙසේ ලියා දැක්වී ය. 1980 දී ඇමරිකානු කර්මාන්තයේ පරිවර්තනය ගැන එහි ලියනු ලැබුවේ "මූලික ව ආයතනයන් තුල පුලුල් පරාසයක වෙනස්වීම් අවශ්‍ය කෙරේ. ආර්ථික ප්‍රතිපත්ති සැකසීමේ රාමුව තුල, ආර්ථික දසුන මත ක්‍රියා කරන ප්‍රධාන නලුවන් - ව්‍යාපාර කම්කරුවන්, ආන්ඩුව හා සුලු ජාතීන් - ගන්නා මාවත තමන් ආර්ථිකයට යොදන්නේ කුමක් ද? හා ඔවුන් ඉන්පිටතට ගන්නේ කුමක් ද? යන්න ගැන සිතිය යුතු ය. මෙම වෙනස්කම්වලින් නව සමාජ කථිකාවතක් පැනනැගිය යුතු ය. එය ආර්ථික වර්ධනය වේගවත් කිරීමට මෙම කන්ඩායම් අතර සෑම අයෙක් ම කුමක් සැපයිය යුතු ද? සෑම අයෙකුට ම ලබාගැනීමට බලාපොරොත්තු විය හැක්කේ කුමක් ද? යන්න ගැන සුවිශේෂ වටහා ගැනීමක් මත පදනම් ව සිදුවිය යුතු ය."

මාස ගනනාවකට පසුව රේගන් ජනාධිපති ලෙස තේරී පත් වූ අතර වෘත්තීය සමිති නිලධරයේ පාවාදීම් මගින් ජයග්‍රහනය සහතික කල, ආන්ඩුවේ අනුග්‍රහය ලත් පෙර නො වූ විරූ ප්‍රහාරයක් කම්කරු පන්තිය මතට එල්ල කෙරෙන කරලිය සැකසිනි:

ප්‍රතිඵල පිලිබිඹු කලේ නො කඩවා ඉහල නගින පොහොසත් ම සියයට එකේ ජාතික ධනයේ පංගුවට සැලසුනු වාසිය

ෆෙඩරල් රිසව් (ඇමරිකානු මහ බැංකුව) බැංකුවේ ආතර් කෙනික්කේල් විසින් කල නව අධ්‍යයනයක් පෙන්නුම් කරන්නේ පොහොසත් ම සියයට 1 ඩොලර් ට්‍රිලියන 2.3ක කොටස් හිමි කර ගන්නා බව යි. එය පුද්ගලික ව හෝ පවුල් වසයෙන් සතු කර ගන්නා මුලු කොටස්වලින් සියයට 53කි. පුද්ගලයන් හෝ පවුල් විසින් හිමි කර ගත් සියලු නයකරයන්ගෙන් සියයට 64ක් ද ඔවුන් සතු ය.

මෙම ප්‍රදර්ශනාත්මක ධන සම්භාරයේ ප්‍රත්‍යනුරූපය වූයේ ඇමරිකානු කම්කරු පන්තියේ පලල් ජනතාව මුහුන දී සිටින එන්ට එන්ට ම අවදානම් තත්වය සහ කම්කරු පන්තියේ දුගීම කොටස් අත්විඳින සැබවින් ම අපේක්ෂාභංග තත්වය යි.


කම්කරු පන්තියේත් එන්න එන්න ම වැඩි කොටස සමන්විත වන්නේ "වැඩ කරන දුගීන්" ලෙස විස්තර

කෙරෙන ප්‍රවර්ගයෙනි. *බිස්නස් වීක්* වාර්තාවකට අනුව "අද වයස අවුරුදු 18-64 අතර කම්කරු බලකායෙන් 1/4ක් වන මිලියන 28කට වැඩි ජනතාව පැයකට ඩොලර් 9.04 ගනනේ උපයන වසරකට ඩොලර් 18,800ක පූර්නකාලීන වැටුප සිව්දෙනෙකුගෙන් යුත් පවුලක දරිද්‍රතා මට්ටමේ ආදායම සලකුනු කර යි.


වැඩකරන දුගීන්ගේ තත්වය *බිස්නස් වීක්* සඟරාව පිලිගනි යි. "උපරිමයෙන් අනාරක්ෂිත කම්කරුවකුට වැරදුනු බසයක්, ඇනහිටි එන්ජිමක්, රෝගී ලමයෙක් යන්නෙහි අර්ථය නම් රැකියාව රැක ගැනීම හා දොට්ට දැමීම අතර, ජීවන පැවැත්ම හා වැලලී යා හැකි ගෙවාගත නො හැකි නය කන්දක් අතර ටෙලිෆෝන් විසන්ධි කිරීම, හදිසියේ එන ඩොලර් 1000 ගෙවල් කුලී බිල්පත් සහිත මූල්‍ය කම්පන අතර වෙනස ය."

"වැඩකාලය අඩුකිරීම, පවුලේ කෑම බජට්ටුව කැපීම හෝ අනෙක් අතට වෙලාවෙන් පසු වැඩ කිරීමට සේවකයාට සිදුකොට දරුවන් බලාගැනීමේ සැලැස්ම බිඳ දමන විනාශයක්, ඕනෑම මොහොතක ලාභ පොම්ප කිරීමට පෙලඹුනු ලොක්කා විසින් ඇති කල හැකි ය. සහනාධාර සඳහා සුදුසුකම් ලැබීමට කාලය මිඩංගු කිරීමට සූදානම් වන විට ම බොහෝදෙන නිතර ම දකින්නේ ඔවුන්ගේ කාලසටහන් වෙනස් කර ඇති බව යි. නිල ඇඳුම් ලා ගැනීමට ගන්නා කාලය, වැසිකිලියට යන කාලය හෝ පුරුදුපරිදි ගන්නා විවේක කාලය පඩි රහිත කොට ඇති බව යි. පැමිනිලි කරන සෑම විට ම ඔහු වෙනුවට තරුන නැවුම් ලාභ හා අඩු පඩියට වැඩ කිරීමට කැමති අයෙක් එක්සත් ජනපදය තුල නිතර ම සිටි යි."9

මේ 2004 වසරේ ඇමරිකා එක්සත් ජනපදය යි.



ප්‍රස්ථාරය 5



ප්‍රස්ථාරය 6

## ඇමරිකානු අර්බුදය හා සමාජවාදය සඳහා ලෝක අපේක්ෂාවන්

එක්සත් ජනපදය තුල ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ බිඳවැටීම යටින් වැටී ඇත්තේ සමාජ අසමානතාවයේ හා ධනය ඒකරාශීවීමේ සීමාන්තික මට්ටම් ය. පසු ගිය තෙවසර තුල ආන්ඩුව විසින් ගනු ලැබුනු පොලිස් රාජ්‍ය පියවරයන්ගේ ඉමහත් පුලුල්වීමට හේතුව ඊනියා "ත්‍රස්තවාදී තර්ජන" නො ව ඇමරිකානු සමාජය තුල තියුනු වන සමාජ හා පන්ති ආතතියෙනි.

එක්සත් ජනපදය (ජාත්‍යන්තරව ද එය එසේ ය යි එකතු කිරීමට කැමැත්තෙමි) තුල දේශපාලනයෙහි ලා, මාක්ස්වාදීන් සපුරා වෙනස් වන රැඩිකල් වමේ අතිශයින් ම ප්‍රකට වූ ද මරනීය වූ ද, දූර්වලතාවය වන්නේ එක්සත් ජනපදයේ ධනේශ්වර පර්යාය ඉතා මූලික ම අර්බුදයකට පත්ව ඇතැ යි යන්න හෝ ඇමරිකානු සමාජයේ මූලික විප්ලවකාරී බලවේගය ලෙස කම්කරු පන්තිය නිර්නය කර ගැනීමට රැඩිකලුන් දක්වන අසමත්කම ය. සමාජීය වසයෙන් කම්කරු පන්තියෙන් විරසක ව සිටින්නා වූ මෙම කන්ඩායම මාධ්‍ය-නිර්මිත ඇමරිකානු සර්ව බලධාරීත්වයේ දේශපාලනිකව මත් ව එක්සත් ජනපදය තුල ධනේශ්වර පර්යායට එරෙහිව සටනක් සඳහා වෛෂයික පදනමක් දැක නො ගනිති. තමන් බලාපොරොත්තු රහිත ලෙස හුදකලාව ඇතැ යි යන හැඟීමෙන් හරිත රැඩිකල් වම්මුන්ගේ සීමාන්තික දිරිසුන් බවට හේතු වී ඇත්තේ මේ තත්වය යි.

භූගෝලීය ආර්ථික විසංවාදයේ අන්තර් ක්‍රියාකාරිත්වය හා එක්සත් ජනපදය තුල පන්ති ආතතීන් උත්සන්නවීම ලෝක අධිරාජ්‍යවාදයේ මර්මස්ථානය තුල විප්ලවකාරී පිපිරීමක් සඳහා කොන්දේසි නිර්මානය

කෙරෙන්නේ කෙසේ දැයි දැකගැනීමට ඔවුහු මුලුමනින් ම අසමත් වෙති.

මෙය ඇමරිකානු වම්මුන්ට සුවිශේෂී වූ දුබලකමක් නො වේ. එය බොහෝ සෙයින් ම ජාත්‍යන්තර ප්‍රපංචයකි. වම්මුන්ගේ මෙම පොදු දේශපාලන අර්බුදයෙහි නොයෙකුත් හැඩතල තිබේ. එහෙත් මෙම අර්බුදයේ හේතුකාරනා විශ්ලේෂනය හා පැහැදිලි කිරීම සඳහා අරගලයේ මූලෝපායික, ඓතිහාසික අත්දැකීම්, විශේෂයෙන් ම සෝවියට් සංගමයේ පරිහානිය හා අවසාන බිඳවැටීමේ හේතු සාධක අධ්‍යයනය කර උකහා ගැනීමට අසමත්වීම පිලිබඳව විශේෂ අවධාරනයක් යෙදීම අත්‍යවශ්‍ය ය.

20 වැනි සියවසේ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයෙහි අවශ්‍ය ම අත්දැකීම් ක්‍රමානුකූලව විග්‍රහ කිරීමෙන් වියෝ වූ කල්හි එසෝසස බිඳවැටීම දැකගනු ලැබ ඇත්තේ බොහෝ දුරට සමාජවාදයේ අසාර්ථකත්වයෙහි ද කම්කරු පන්තිය මත පදනම් වූ විප්ලවකාරී ඉදිරිදර්ශනයක බංකොලොත්කම සනාථවීමක් ද ලෙස ය.

එසේ වුව ද මෙම ඉතිහාසය හදාරා ඇති අයට එසෝසස බිඳවැටීම හා කම්කරු පන්තියේ පරාජයත් නො වැලැක්විය හැකි හා පූර්ව නියමිත වී නො තිබුනා වූ සමාජවාදය කරා ජාතික මාවතක් පිලිබඳ ප්‍රතිමාක්ස්වාදී හා ප්‍රතිගාමී සංකල්පයන් මත පදනම් වූ සාවද්‍ය ප්‍රතිපත්තීන්හි ප්‍රතිඵලය බව වටහාගත් අයට වත්මන් දේශපාලන තත්වය දර්ශනය වන්නේ බෙහෙවින් වෙනස්ව ය. අතීත අධ්‍යයනයෙන් උපුටා ගත් පාඩම් වර්තමානය අවබෝධ කර ගැනීමේ යතුරක් සම්පාදනය කර යි.

අප එලඹෙමින් සිටින්නේ න්‍යායික චින්තනයේ ශ්‍රේෂ්ඨ ඉදිරි පියවරයන් දෙකක් සමරන්නා වූ වර්ෂයකට ය. 2005 වසර විශ්වය පිලිබඳ මිනිසාගේ සංකල්පය පරිවර්තනය කිරීමට තුඩුදුන්නා වූ අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදී න්‍යායේ ආරම්භක සූත්‍රගත කිරීමෙන් සියවස් පූර්නය යි. එමෙන් ම එය 20 වැනි සියවස තුල පැනනැංගා වූ ප්‍රථම ශ්‍රේෂ්ඨ විප්ලවකාරී කම්කරු පන්ති අරගලය වන 1905 රුසියානු විප්ලවයේ සියවස ද සපුර යි. එම වර්ෂයේ සිදුවීම් ලියොන් ට්‍රොට්ස්කි විසින් නො නවතින විප්ලවයේ න්‍යායික සූත්‍රගත කිරීම වසයෙන් ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ න්‍යායික චින්තනය තුල දැවැන්ත ඉදිරි පිම්මක් සඳහා ප්‍රවේගය සැපයී ය.

දෙන ලද ඕනෑම රටක සමාජවාදය සඳහා ශක්‍යතාවය එම රටේ කාර්මික සංවර්ධනයේ මට්ටම පදනම් කර ගනිමින් තක්සේරු කිරීමට යොමු වූ එකල පැතිර පැවති ජාතිකවාදී සංකල්පයන්ට අභියෝග කරමින් ට්‍රොට්ස්කි සමාජවාදය සඳහා ගතික ආවේශය නැගී එන්නේ ලෝක ආර්ථිකයේ පොදු සංවර්ධනය කෙරෙන බව පෙන්වා දුනි. ඕනෑම රටක් තුල විප්ලවකාරී අර්බුදයක් පැනනංවන තීරනාත්මක සාධකය වනාහි විශේෂිත වූ අසාමාන්‍ය වූ ජාතික තත්වයන් සමූහයකගේ නිෂ්පාදිතයක් නො ව ජාත්‍යන්තර ධනවාදයේ විසංවාදයන් බව ඔහු හෙලිදරව් කලේ ය. තව ද සමාජවාදී විප්ලවයේ හේතු සාධක භූගෝලීය ආර්ථික තත්වයන් තුල මුල්බැස තිබෙන තතු තුල කම්කරු පන්තිය විසින් බලය අල්ලා ගැනීමෙන් පසුව ද සමාජවාදයට ජාතික මාවතක් තිබිය නො හැකි ය. කම්කරු පන්තිය සඳහා වූ එක ම ශක්‍ය මූලෝපාය වනාහි එකට බැඳුනු, අන්තරාධීන (එකක් අනෙක මත රැඳුනා වූ) ලෝක විප්ලවකාරී ක්‍රියාවලියක් ලෙස සමාජවාදය ගොඩනැගීම අරගලයේ සංකල්පනය කලා වූ එම මාවත පමනි.

ට්‍රොට්ස්කිගේ නො නවතින විප්ලවයේ න්‍යායෙන් ගෙන හැර පෑ න්‍යායික හා දේශපාලනික කරුනු හුදෙක් වියුක්ත ඓතිහාසික ගැටලු නො වේ. ඒවා වත්මන් ලෝක තත්වය තේරුම් ගැනීමට හා කම්කරු පන්තියේ කර්තව්‍යයන් සඳහා පදනමක් සකස යි.

නො නවතින විප්ලවයේ න්‍යායට සතුරු වූ "තනිරටේ සමාජවාදය" ධජය යටතේ ප්‍රකාශිත වූ අවසාන වසයෙන් එසෝසස බිඳවැටීමට තුඩු දුන් ස්ටැලින්ගේ සමාජවාදයට ජාතික මාවතක් පිලිබඳ සංකල්පයේ ලීලාව සත්තකින් ම දීර්ඝ වසයෙන් පරීක්ෂා කිරීමට අපට පුලුවන. මෙම අත්දැකීම අධ්‍යයනය කිරීම වනාහි 20 වැනි සියවසේ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ ඉරනම න්‍යායික ව හා දේශපාලනික ව අවබෝධ කර ගැනීමේ ප්‍රාථමික මූලාශ්‍රය වේ. තව ද අද දින රුසියාවේ පැතිර පවතින ව්‍යසනකාරී තත්වයන් විසින් පෙන්නුම් කෙරෙන්නේ 1917 දී බොල්ෂෙවිකයන් විසින් බලය අල්ලා ගැනීමේ දී මූලිකව ම පදනම් වූ ජාත්‍යන්තර මූලෝපාය පාවාදීමේ ප්‍රතිවිපාකයන් ය.

අප චීනයේ ඉරනම දෙස ද බැලිය යුතු ය. වාම රැඩිකල් ප්‍රවනතාවන් විප්ලවවාදී චින්තනයේ අවසාන වචනය මාවෝවාදී තුච්ඡ මුග්ධත්වය ("බලය තුවක්කු කටකින් පිටතට එයි") තුල සොයාගත් බව විශ්වාස කලේ එතරම් ඈත කාලයක නො වේ. සැබවින් ම ට්‍රොට්ස්කිවාදයේ වඩාත් ම දුෂ්ඨ සතුරන් දක්නට ලැබුනේ ලොව පුරා මාවෝවාදී කන්ඩායම් අතර ය. ලියොන් ට්‍රොට්ස්කිගේ අදහස් කෙරෙහි යම් තරමක දේශපාලන අනුකූලතාවක් කියා පෑවා වූ රැඩිකල් ප්‍රවනතා පවා සමාජවාදයේ ජයග්‍රහනය සඳහා හතරවැනි ජාත්‍යන්තරය ගොඩ නැගීම අත්‍යාවශ්‍ය යයි ට්‍රොට්ස්කි කල ප්‍රකාශයන් චීන විප්ලවයේ ජයග්‍රහනය මගින් ප්‍රතිෂේධව ඇතැයි යන මතය නිරතුරු ඉදිරිපත් කලහ. මාවෝ, සහ පසුව හෝ චි මින් පමනක් නොව කැස්ත්‍රෝ ද ට්‍රොට්ස්කිව අතික්‍රමනය නො කලෝ ද? ඔවුන් මාක්ස්වාදයේ පෞරානික ''ස්වභාවය'' යල්පිනූ සංකල්ප විධි හා ඉදිරිදර්ශන අතික්‍රමනය කර තිබුනේ නැත් ද? මාවෝවාදී පක්ෂයේ නිර්ධන පන්තික නොවන පදනමත්, නිලධාරිවාදී ස්වභාවයත්, විවේචනයට ලක් කොට, එමගින් තහවුරු කල තම න්‍යායික අප්‍රතිහතභාවය හේතු කොට ගෙන දශක ගනනාවක සිරබන්ධනවලට [මාවෝවාදීන් විසින් - පරිවර්තක]

භාජන කරනු ලැබූ චීන ට්‍රොට්ස්කිවාදීහු කමකට නැති ''කට්ටිවාදීන්'' හා විප්ලවයෙන් පලාගිය ''සරනා'පගතයන්'' නො වූවාහු ද?

අප 2004 වසර කරා ''වේගයෙන් ඉදිරියට'' යමු. මාවෝගේ චීනයට සිදු වී ඇත්තේ කුමක් ද? අද චීනය වනාහී ලෝක ධනවාදය සිය පන බේරා ගැනීම සඳහා පය ගසාගෙන සිටින්නාවූ ලාභ ශ්‍රම පදනම ය. නූතන ලෝක ආර්ථිකයේ සමීකරනයන්ගෙන් චීනය අයින් කල හොත් ඇමරිකානු ධනවාදයේ වත්මන් තත්වය කෙබඳුවේ ද? 2003 වසරේ දී එක්සත් ජනපදය හා චීනය අතර ද්විපාර්ශ්වික වෙලඳාම ඩොලර් බිලියන 190 ඉක්මවී ය. එය කැනඩාව හා මෙක්සිකෝවට පසු එක්සත් ජනපදයේ තෙවැනි විශාලතම වෙලඳ සගයා ය. ඇමරිකාව චීනය සමග කල වෙලඳාමේ හිඟය ඩොලර් බිලියන 135කි. මෙය එක්සත් ජනපදයේ ඉතිහාසය තුල ඕනෑම රටක් සමග පැවති විශාලතම හිඟය යි.

චීන රජය විසින් විකුනා දමන වත්කම් ඩැහැ ගැනීමට හා චීනයේ දැවැන්ත අභ්‍යන්තර වෙලඳපොල විනිවිදීම තව දුරටත් ගැඹුරු කිරීමට එක්සත් ජනපද ධනපතියන් බලා සිටින අතර ඇමරිකානු ප්‍රාග්ධනය චීනය තුලට ගලා එමින් පවතී.

ඇමරිකානු ධනපතියන් චීනය වෙත ආකර්ශනය වන්නේ කුමක් විසින් ද? මිනිස් වෙස් ගත් වෘකයන්ගේ බඳු වූ අතිරික්ත වටිනාකම හා ලාභ සඳහා ඔවුන්ගේ සාගින්න තියුනු කරන්නේ සියල්ලට ම වඩා ශ්‍රමයේ අඩුමිල විසිනි. චීන කම්කරුවා උපයන්නේ ඇමරිකාවේ හෝ යුරෝපයේ ඒ සමාන කම්කරුවෙකුට ගෙවන වැටුපෙන් පහලොවෙන් පංගුවක්, විස්සෙන් පංගුවක් තරම් මුදලකි. ඇඟලුම් කර්මාන්තය තුල ප්‍රමුඛයා වන චීනය තුල පැයක සාමාන්‍ය වැටුප වන ඇමරිකානු ශත 40 මෙක්සිකෝවේ කම්කරුවෙකුට ගෙවන වැටුපෙන් 1/3කටත් වඩා අඩු ය. එක්සත් ජාතීන් තක්සේරු කලේ චීන ජාතිකයන්ගෙන් සියයට 16.1ක් වන මිලියන 208ක ජනයා උපයන්නේ දිනකට ඩොලරයකට වඩා අඩුවෙන් බව ය; ජනගහනයෙන් සියයට 47.3ක් හෙවත් මිලියන 615ක් දෙනා ජීවත්වන්නේ දිනකට ඩොලර් 2කට වඩා අඩු මුදලකින් බව යි. ලෝක බැංකුවට අනුව ලෝකයේ වඩාත් ම ආකර්ශනීය ආයෝජන කලාපයන්ගෙන් එකක් බවට චීනය පත්ව ඇත්තේ මේ නිස යි.

අධිරාජ්‍යවාදීන් විසින් චීනය සුපිරි සූරාකෑම සඳහා විවෘත කිරීම මගින් බිහිසුනු සමාජ මිලක් මිරිකාගෙන ඇත. අධිරාජ්‍යවාදී ආයෝජනයේ වාසි දූෂිත චීන රාජ්‍ය හා පක්ෂ නිලධරය විසින් අත්කර ගන්නා කල්හි මිලියන සියගනනක් විශේෂයෙන් ම ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට එය බලපා ඇත්තේ ව්‍යසනයකට වඩා අඩු දෙයක් නො වේ.

චීනයේ ඉරනම හා ලෝක ආර්ථිකය තුල එහි භූමිකාව අධ්‍යයනය කරන කල්හි පැහැදිලි වන කරුනක් නම් ස්ටැලින්වාදයේ එක් ප්‍රභේදයක් වන මාවෝවාදය ඇමරිකානු හා ලෝක අධිරාජ්‍යවාදයේ පන බේරාදීමට වැදගත් දායකත්වයක් සපයන්නේ ය යන්න පැහැදිලි වෙතැ යි අප කියන කල්හි එය අතිශයෝක්තියක් නො වේ.

කෙසේ වුව ද මෙහි තවත් පැත්තක් ඇත. චීනයේ ලාභ වැටුප් ශ්‍රමය මත ඇමරිකානු හා ජාත්‍යන්තර ප්‍රාග්ධනය රඳා පවතී ය යන කාරනය ම, දරුනු සූරා කෑමකට පාත්‍රවීම නිසා චීනය තුල අනිවාර්යයෙන් ම පැනනගිනු ඇති ස්ඵෝටනීය (පුපුරන සුලු) සමාජ විපාකයන්ට ඇමරිකාව ම දරුනු ලෙස විවෘත කරලයි.

මෙලෙස අප පිවිසෙමින් සිටින්නේ විප්ලවකාරී පන්ති අරගලය වැඩිවැඩියෙන් ලෝක පරිමාන ව සම්පාතවීම යන්නෙන් අංග ලක්ෂිත වූ නව කාල පරිච්ඡේදයකට ය. මාක්ස්වාදී ව්‍යාපාරය අද දින මුහුන දෙන අභියෝගය වන්නේ මෙම ලෝක ව්‍යාපාරය සාරභූත වසයෙන් ම අත්‍යන්ත ජාත්‍යන්තර වූ ස්වභාවය පිලිබඳ දැනුවත් භාවයෙන් සන්නද්ධ කිරීම ද සමාජවාදය පිලිබඳ ඒත්තු ගැන්වීම මගින් එය ප්‍රානවත් කිරීම ද පසු ගිය සියවසේ පාඩම්වල පදනම මත උගන්වා ගැනීම ද වේ.

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවත් *ලෝක සමාජවාදී වෙබ් අඩවියත්* සමාජවාදී සමානතා පක්ෂයත් 2004 මැතිවරනයට මැදිහත්වීමේ දී පදනම් වන ඉදිරිදර්ශනය මෙය යි.

පසු ගිය සයමස තුල සමාජවාදී සමනතා පක්ෂය එහි අපේක්ෂකයන් ජාතික, ප්‍රාන්ත හා ප්‍රාදේශීය මැතිවරන ලේඛනයට හැකි වැඩි ම ප්‍රාන්ත ගනනක දී ඇතුල් කර ගැනීම සඳහා ධෛර්යමත්, දෘඪ උද්ඝෝෂනයක යෙදී සිටි යි. දුෂ්කර ක්‍රියාවලියක් වන එහි දී රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් යන දෙපක්ෂයෙන් පිට අපගේ අපේක්ෂකයන්ට තුන්වැනි පක්ෂ අපේක්ෂකයන් සකසා තිබෙන නිල ඡන්ද ලේඛන තත්වය ලැබීම වැලැක්වීමට තිබෙන ප්‍රති-ප්‍රජාතන්ත්‍ර මැතිවරන නීතිවලට එරෙහිව සටන් වැදීමට බලකරනු ලැබ තිබේ. බොහෝ ප්‍රාන්ත තුන්වැනි පක්ෂවලට ඡන්ද ලේඛනයේ පෙනීසිටීමට ඉටු කල නො හැකි තරම් දස දහස් සංඛ්‍යාවක් අත්සන් ලබාගත යුතු යයි ඉල්ලා සිටියි. තෙවැනි පක්ෂ අපේක්ෂකයන්ගේ පෙත්සම්වල අඩංගු අත්සන් ඩිමොක්‍රැටික් පක්ෂයේ ක්‍රමානුකූල අභියෝගයට ප්‍රතිපත්තිමය කාරනයක් ලෙස ම ලක් කර ඇත.

සමාජවාදී සමානතා පක්ෂය පසු ගිය මාස කිහිපය තුල එවන් අභියෝගයන් සමග පොරබදා ඇත. මෙතෙක් දුරට අප අපගේ ජනාධිපති හා උපජනාධිපති අපේක්ෂකයන්ගේ නම් නිව් ජර්සි, ඔහියෝ, අයෝවා, කොලරාඩෝ හා වොෂින්ටන් ඡන්ද පත්‍රිකාවලට (එක්සත් ජනපද ජනාධිපතිවරනයේ දී එක් එක් ප්‍රාන්තය වෙන වෙන ම ඡන්ද පත්‍රිකා මුද්‍රනයක් ද ඇතුලත් කර තිබේ. ජනාධිපති අපේක්ෂක බිල්වැන් ඕකන් හා උප ජනාධිපති අපේක්ෂක ජිම් ලෝරන්ස් දෙදෙනාගේ නම් මිනෙසෝටාහි දී ද සහතික කෙරෙනු ඇත. මේන්,

මිචිගන් හා ඉලිනොයිස්හි ප්‍රාන්ත හා ප්‍රාදේශීය ඡන්ද ලේඛනවල ද සසප අපේක්ෂකයන් ඇතුලත් වනු ඇත.

අපගේ අපේක්ෂකයන්ගේ නම් ඡන්ද පත්‍රිකාවල සටහන් ව ඇති සෑම තැනක දී ම ඔවුන්ට ඡන්දය දෙන ලෙස අප වැඩ කරන ජනතාවගෙන් ඉල්ලා සිටිමු. ඔහායෝහි කොන්ග්‍රස් මන්ඩල අපේක්ෂක ලෙස ඉදිරිපත් වූ ඩේවිඩ් ලෝරන්ස්ගේ ප්‍රශ්නයේ දී එනම් ඔහු ප්‍රජාතන්ත්‍රවාදී නො වන නො මනා නීති මගින් ඡන්ද පත්‍රිකාවෙන් ඉවත් කොට තිබෙන තතු තුල ඔහුගේ නම එහි ලියා ඔහුට ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටිමු.

එහෙත් අප ව්‍යාපාරයේ කේන්ද්‍රීය අරමුන ඡන්ද දිනාගැනීම නො ව, ලෝක සිද්ධීන් පිලිබඳ කම්කරු පන්තියේ අවබෝධය ගැඹුරු කිරීමටත් පන්ති විඥානය වර්ධනය කිරීමටත් එහි දේශපාලන අධ්‍යාපනය සඳහාත් දායක වීම යි.

වසර 66කට පමන පෙර හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ දී ලියොන් ට්‍රොට්ස්කි මෙසේ කීවේ ය.

"අප අනෙකුත් පක්ෂවලට සමාන පක්ෂයක් නො වේ. අපගේ අභිලාෂය වැඩිපුර සාමාජිකයන්, වැඩිපුර පුවත් පත්, වැඩිපුර මුදල් හෝ වැඩිපුර ක්‍රියාකාරීන් දිනාගැනීම පමනක් නො වේ. ඒ සියල්ල අවශ්‍ය වන නමුත් ඒ මාධ්‍යයන් ලෙස ය. අපගේ අරමුන සමාජවාදී විප්ලවය මගින් සූරාකෑමට ලක් වූ වැඩ කරන ජනතාවගේ පූර්න අධ්‍යාත්මික හා ද්‍රව්‍යමය විමුක්තිය යි. අප හැර වෙන කිසිවෙකුත් එය සූදානම් කරනු හෝ ඊට මගපෙන්වනු නැත."

වසර 66කට පසුව හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවෙහි ඉදිරිදර්ශනය වී ඇත්තේ ද එය යි. එය දිනා ගැනීමට කෙටි මාවත් ඇත්තේ නැත. සමාජවාදය ජය ගත හැක්කේ ශූර උපායන්ගේ සමස්ත එකතුවක් මගින් නො වේ; එය සටන්කාමී වෘත්තීය සමිති ඉල්ලීම් හා විරෝධතා පෙලපාලිවල අවිඥානක අතුරු නිෂ්පාදනයක් ද නො වේ. අරගලයේ, එවන් රූපයන්ට යම් භූමිකාවක් පවත්නා නමුත් ඒවා මාක්ස්වාදය සඳහා නිශ්චිත සටනට ආදේශකයක් නො වේ. පන්ති විඥානයෙන් යුතු කම්කරුවන් විශාල කොටසක් අතර විද්‍යාත්මක ලෝක විප්ලවවාදී දෘෂ්ටියක් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය සමාජවාදය සාක්ෂාත් කර ගත හැක්කේ ලෝක පරිමාන ව බලය අත් කර ගැනීම හැරෙන්නට අපගේ යුගයේ ගැටලුවලට වෙනත් විසඳුම් නො පවත්නා බව පැහැදිලි කිරීමට වෙහෙස නො බලා කරන නිර්දය අරගලයක් හරහා පමනක් වන අතර මේ පදනම මත කම්කරු පන්තිය තුල බලගතු ජාත්‍යන්තර සමාජවාදී සංස්කෘතියක් යලි ගොඩනැංවේ.

2004 සැප්තැම්බර් 07

**සටහන්:**

1. "America and the Ambivalance of power, current History, November 2003 pp. 377-82. "ඇමරිකාව සහ බලය පිලිබඳ දෙගිඩියාව", වත්මන් ඉතිහාසය, 2003 නොවැම්බර්, පිටු 377-82
2. "Riding for a fall, "Foreign Affairs, sep/oct 2004, p.119. "කඹය උඩ ඇවිදීම, විදෙස් සබඳතා, 2004 සැප්තැම්බර්/ඔක්තෝබර්, පිටුව: 119
3. 2004 අගෝස්තු 17
4. "Riding for a fall", p.112 "කඹය උඩ ඇවිදීම", පිටුව: 112
5. Ibid, p. 113. එහිම, පිටුව. 113
6. See "African oil and US Security Policy" by Michael T. Klare and Daniel Volman, Current History, May 2004. බලන්න, "අප්‍රිකානු තෙල් සහ එක්සත් ජනපද ආරක්ෂක පිලිවෙත", මයිකල් ටී. ක්ලෙයාර් සහ ඩැනියෙල් වොල්මන්, වත්මන් ඉතිහාසය, 2004 මැයි.
7. "Manifesto of the Fourh International", in Writings of Leon Trotsky (1939-40). "හතර වන ජාත්‍යන්තරයේ ප්‍රකාශනය", ලියොන් ට්‍රොට්ස්කිගේ ලියැවිලි (1939-40) (නිව් යෝර්ක්, 2001) පිටුව. 223
8. මෙම වගු, www.inequality.org වෙබ් අඩවියෙන් සොයා ගැනුනු ලිපි ලේඛන ආශ්‍රයෙන් ප්‍රති නිශ්පාදිත ය.
9. "Business Week" May 31, 2004. (New York, 2001), p, 223. "බිස්නස් වීක්" 2004 මැයි 31, පිටුව. 61
10. "Partners and Competitors; Coming to terms with the new US - China economic relationship bu Bates Gill and Sue Ann Tay, center for strategic and International Studies." "කොටස්කරුවෝ සහ තරගකරුවෝ": නව එක්සත් ජනපද-චීන ආර්ථික සබඳතාව පිලිබඳ එකඟතා, බේට්ස් ග්‍රිල් සහ සූ ඈන් ටේ, මූලෝපායික සහ ජාත්‍යන්තර අධ්‍යාපන කේන්ද්‍රය.

©www.wsws.org